## දුකින් නිදහස් කරලන සනාතන රැකවරණය

# සතර සතිපට්ඨානය

යමෙකුට මෙලොව ඇති ඉහළ ම රැකවරණය වන්නේ කෙලෙස්වලින් තම සිත ආරක්ෂා කර ගැනීමයි. එහිලා සතර සතිපට්ඨානය උතුම් ව ක්ෂේම භූමිය වශයෙන් බුදුදහමෙහි දක්වා තිබේ. විශේෂයෙන් බුදුරදුන් වෙත පැවිදි වූ ශ්‍රාවකයන්ගේ පිත්‍රෘවිෂය (පියාගේ වපසරිය = ගොදුරුබිම) ලෙස දක්වා ඇත්තේ සතර සතිපට්ඨානයයි (*ගොචරෙ භික්ඛවෙ, චරථ සකෙ පෙත්තිකෙ විසයෙ*). තම ශ්‍රාවකයන්ට සතර සතිපට්ඨානය නමැති සිය පියාගේ විෂයයෙහි හැසිරෙන ලෙසත් එසේ හැසිරීමෙන් අනතුරකින් තොර ව ධර්ම මාර්ගයෙහි ගමන් කළ හැකි බවත් බුදුරදුන්ගේ අනුශාසනයයි. විශේෂයෙන් අලුතින් පැවිදි ව සසුන්වන් නවක පැවිද්දන් මෙම සතර සතිපට්ඨානයෙහි හික්මවන ලෙස භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේට අනුශාසනා කළහ. සම්බුදු සසුන විෂයයෙහි ශ්‍රද්ධාවත් ශීලයත් ප්‍රඥාවත් වැඩදියුණු වීමට මෙම දහම් මග බෙහෙවින් උපකාරී වීම මීට හේතුවයි. තවද කිසියම් භික්ෂුවක් තමා තමාට ම ප්‍රදීපයක් (නොහොත් දිවයිනක්) සරණක් කොට වෙසේ නම් කළ යුත්තේ මෙම සතර සතිපට්ඨානය වැඩීම බව සඳහන් වේ. යමෙකුට සැබෑ රැකවරණයක් සැලසෙන්නේ සතිපට්ඨානය වැඩීමෙනි. සත්ත්වයාගේ ඇස, කන ආදි පංච ඉන්ද්‍රියයන්ට රැකවරණය සිතයි. හුදෙක් සිතක් තිබූ පමණින් එයට ආරක්ෂාවක් නොමැත. **සිතට රැකවරණය ලෙස දක්වා ඇත්තේ සිහිය හෙවත් සතිමත් (Mindfulness) බවයි.** එම සිහියට රැකවරණයක් ලැබෙන්නේ කෙලෙසුන්ගෙන් සිත මුදවා ගැනීම නම් වූ විමුක්තිය තුළිනි. විමුක්තිය නිවන පිළිසරණ කොට පවතී. එමනිසා සතිපට්ඨානය වැඩීම රාග, ද්වේෂ, මෝහ දුරුකිරීම සඳහා වූ අසංඛත මාර්ගය ලෙස විස්තර වේ (සතිපට්ඨාන සූත්ත, සං.නි. සළායතන වග්ග). සතිමත් බව වඩන විට සත්ත බොජ්ඣංග සම්පූර්ණ වී විද්‍යා විමුක්තිය සම්පූර්ණත්වයට පත් වන බව දක්වා තිබේ (අවිජ්ජා සූත්ත, අං.නි. දසක නිපාත).

නිවන් මග විවරණය කෙරෙන සූත්‍ර ධර්ම අතර මහාසතිපට්ඨාන සූත්‍රයට (දී.නි. 2, 436-502 පිටු) ප්‍රධාන තැනක් හිමි වේ. සම්පූර්ණ නිවන් මග සවිස්තරාත්මක ව එහි සඳහන් ව ඇත. බුදුදහමෙහි ප්‍රධාන ඉගැන්වීම් රැසකට මහාසතිපට්ඨාන සූත්‍රයේ ඇතුළත් කරුණු සම්බන්ධ ව පවතී. සංසාරගත සත්ත්වයා අනාදිමත් කාලයක් තිස්සේ අපමණ දුක් රැසක් විඳිමින් සසර සැරිසරන්නේ ලෝකය පිළිබඳ වැරදි ආකල්ප හතරක් නිසාවෙනි. මෙය 'සතර විපල්ලාස' නමින් හැඳින්වේ. ඒවා නම් :-

1. අසුභෙ සුභසඤ්ඤා (අසුභ දෑ සුබ වශයෙන් හඳුනා ගෙන සිටීම)
2. දුක්ඛෙ සුඛසඤ්ඤා (දුක් දෑ සැප වශයෙන් හඳුනා ගෙන සිටීම)
3. අනිච්චෙ නිච්චසඤ්ඤා (අනිත්‍ය දෑ නිත්‍ය වශයෙන් හඳුනා ගෙන සිටීම)
4. අනත්තෙ අත්තසඤ්ඤා (අනාත්ම දෑ ආත්ම වශයෙන් හඳුනා ගෙන සිටීම)

හුදෙක් යමක් අසුභ හෝ දුක් හෝ අනිත්‍ය හෝ අනාත්ම හෝ වූ පමණින් සත්ත්ව සන්තානයට දුක හට නොගනී. දුක හටගන්නේ අසුභ දේ සුභ ලෙසත් දුක් දේ සැප ලෙසත් අනිත්‍ය දේ නිත්‍ය ලෙසත් අනාත්ම දේ ආත්ම ලෙසත් වශයෙන් පවත්නා වැරදි චින්තනය නිසයි. මහාසතිපට්ඨාන සූත්‍රයෙහි සඳහන් සතර සතිපට්ඨානයෙන් ඉහත දක්වූ සතර විපල්ලාස දුරුවීමට මග පෙන්වයි. කායානුපස්සනාවෙන් 'අසුභෙ සුභසඤ්ඤාව' ද වේදනානුපස්සනාවෙන් 'දුක්ඛෙ සුඛසඤ්ඤාව' ද චිත්තානුපස්සනාවෙන් 'අනිච්චෙ නිච්චසඤ්ඤාව' ද ධම්මානුපස්සනාවෙන් 'අනත්තෙ අත්තසඤ්ඤාව' ද දුරුවීමට අනුශාසනා කෙරේ. මෙලෙස සතර සතිපට්ඨානය වැඩීමෙන් සතර විපල්ලාස දුරුවන අතර, සතර ආහාරය පිරිසිඳ දැනීමට ද අවකාශ සැලසේ. කායානුපස්සනාව වැඩීමෙන් 'කබලිංකාර ආහාරය' පිරිසිඳ දැනීමටත් වේදනානුපස්සනාව වැඩීමෙන් 'ඵස්ස ආහාරය' පිරිසිඳ දැනීමටත් චිත්තානුපස්සාව වැඩීමෙන් 'විඤ්ඤාණ ආහාරය' පිරිසිඳ දැනීමටත් ධම්මානුපස්සනාව වැඩීමෙන් 'මනෝසඤ්චේතන ආහාරය' පිරිසිඳ දැනීමටත් හැකියාව ලැබේ.

භාග්‍යවතුන් වහන්සේ දුක පිළිබඳ විග්‍රහ කරමින් ජාති, ජරා, මරණාදි දුක් දක්වා ඒ සියල්ලට ම පදනම ලෙස දක්වූයේ උපාදානස්කන්ධ පංචකයයි (*සංඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා*). සතර සතිපට්ඨානය වැඩීම ස්කන්ධපංචකය පිරිසිඳ දැන ඊට ඇති ඇල්ම දුරුකර දුකින් නිදහස් වීමට හේතු වේ. ඒ අනුව කායානුපස්සනාව වැඩීමෙන් රූපස්කන්ධය පිරිසිඳ දැනීමටත් වේදනානුපස්සනාව වැඩීමෙන් වේදනාස්කන්ධය පිරිසිඳ දැනීමටත් චිත්තානුපස්සනාව වැඩීමෙන් විඤ්ඤාණස්කන්ධය පිරිසිඳ දැනීමටත් ධම්මානුපස්සනාව වැඩීමෙන් සඤ්ඤා, සංඛාර යන ස්කන්ධ පිරිසිඳ දැනීමටත් අවකාශ සැලසේ. තවද සමස්ත බුද්ධවචනය නාමරූප පිරිසිඳ දැන ඒ කෙරෙහි පවත්නා ඇල්ම දුරුකිරීමට මග පෙන්වන දහමකි. කායානුපස්සනාවෙන් රූප ද සෙසු අනුපස්සනා තුනෙන් නාම ද පිරිසිඳ දැනීමට මග පෙන්වයි. මෙලෙස සතර සතිපට්ඨාන වැඩීම සම්මුති වශයෙන් සත්ත්වයා යනුවෙන් ව්‍යවහාර කෙරෙන සියල්ල වටහා ගැනීමටත් තෘෂ්ණා, දෘෂ්ටි, මාන වශයෙන් ඒ පිළිබඳ ව පවත්නා සියලු ආශ්‍රව දුරු කිරීමටත් මාවත වේ. සතර සතිපට්ඨානය වැඩීම සමස්ත බුද්ධවචනය අනුගමනය කිරීමක් වන අතර එය සම්මා දිට්ඨිය පෙරටු කොටගත් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා සතිය තුළින් ප්‍රකට වන්නකි.

කුරුරට කම්මාසදම්ම නම් කුරුවැසියන්ගේ නියම්ගමෙහි දී දේශනා කරන ලද මහාසතිපට්ඨාන සූත්‍රය (දී.නි. 2, 436-502 පිට) ආරම්භයෙහි දී ම බුදුරජාණන් වහන්සේ සතර සතිපට්ඨාන වැඩීමෙන් අත්වන ප්‍රතිඵල ලෝකය හමුවේ ඉදිරිපත් කරති. සතිපට්ඨානය වැඩීමේ ප්‍රතිඵල වශයෙන්,

සත්ත්වයන්ගේ පිරිසිදු බව සඳහා (*සත්තානං විසුද්ධියා*)

සෝක පරිදේවයන් ඉක්මවීම සඳහා (*සොකපරිද්දවානං සමතික්කමාය*)

දුක් දොම්නස් නිමා කිරීම සඳහා (*දුක්ඛ දොමනස්සානං අත්‍ථංගමාය*)

ඥාණය උපදවා ගැනීම සඳහා (*ඤායස්ස අධිගමාය*)

නිර්වාණය සාක්ෂාත් කිරීම සඳහා (*නිබ්බානස්ස සච්ඡිකිරියාය*)

ඒකායන ප්‍රතිපදව ලෙස දේශනා කොට ඇත්තේ සතර සතිපට්ඨානයයි

(*ඒකායනො අයං භික්ඛවේ මග්ගො ........... යදිදං චත්තාරො සතිපට්ඨානා*)

ලොව වෙසෙන ඕනෑම පුද්ගලයකුගේ උසස් අභිලාස කිහිපයක් මෙහි සඳහන් ව ඇත. මෙකී ප්‍රතිඵල සාක්ෂාත් කරගනු වස් ආරම්භයේදී ම තමා තුළ ඇති කර ගත යුතු ලක්ෂණ කිහිපයක් සූත්‍රයෙහි දැක්වේ. එනම් කෙලෙස් තවන වීර්යයෙන්, නුවණින් සිහියෙන් යුතු ව ලෝකය හෙවත් පඤ්චස්කන්ධය පිළිබඳ ව දැඩි ලෝභය හා දොම්නස දුරු කොට (*'...ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං....'*) සතිපට්ඨානයෙහි යෙදිය යුතු බව බුදුරජාණන් වහන්සේ අනුශාසනා කරති. සිතෙහි දැඩි ලෝභය හා දොම්නස භාවනාවට බාධාවකි. එබැවින් ලෝභය හැකිතාක් අවම කොට දොම්නස් සිතිවිලිවලින් තොර ව ධර්මානුකූල ප්‍රීතියක් සහිත ව භාවනාවට සූදනම් වීම අවශ්‍ය කෙරේ. සතිපට්ඨානය වැඩීමට අපේක්ෂා කරන්නකු විසින් මෙම කරුණු පිළිබඳ ව මුල දී ම දැනුවත් ව එය අනුගමනය කළ යුතු ය.

තවද සතර සතිපට්ඨානය වැඩීමේ දී කුසල දහම්හි ආරම්භයේ දී පාරිශුද්ධත්වය ඇති කර ගත යුතු බව සඳහන් ව ඇත. මෙහි කුසල දහම්හි ආරම්භය වශයෙන් දක්වා ඇත්තේ සීලයෙන් පිරිසිදු බවට පත් ව දෘෂ්ටිය ඍජු කර ගැනීමයි. (... *ආදිමෙ'ව විසොධෙහි කුසලෙසු ධම්මෙසු. කො ච ආදි කුසලානං ධම්මානං සීලං ච සුවිසුද්ධං, දිට්ඨි ච උජුකා.* භික්ඛු සුත්ත, සං.නි.5-1, සතිපට්ඨාන සංයුත්ත). ඒ අනුව පංචශීලය ආදි ශීලයක මැනැවින් පිහිටා ශාශ්වත, උච්ඡේද යන අන්තද්වයෙන් තොර ව දර්ශන සම්පත්තියෙන් යුතු ව සතර සතිපට්ඨානය භාවිත කළ යුතු ව ඇත.

'සති' යනු සිහියයි. 'පට්ඨාන' යනු නිවැරදි ලෙස පිහිටුවා ගැනීමයි. ඒ අනුව 'සතිපට්ඨාන' යනු අපගේ අවධානය හෙවත් සිහිය නිවැරදි ලෙස පිහිටුවා ගත යුතු ආකාරය පිළිබඳ විස්තර වන අනුශාසනයයි. බුදුරජාණන් වහන්සේ විසින් දේශිත නිවී සැනැහෙන මාවතෙහි වැඩිය යුතු ගුණාංග අතර සතිපට්ඨානයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. සතිසම්පජඤ්ඤ, සතර සතිපට්ඨාන, සති ඉන්ද්‍රිය, සති බල, සති

සම්බොජ්ඣංග, සම්මා සති ආදි මූලික ඉගැන්වීම් රැසක ප්‍රධාන කරුණක් ලෙස සතිය විස්තර කොට ඇත්තේ එබැවිනි. අප කෙතෙක් දුර කෙලෙස් දුරලමින් මානසික සුවය ලබා ගැනීමෙහි නිරත වී සිටිනවා ද යන්න තීරණය කෙරෙන ප්‍රධාන සාධකයක් වන්නේ සතිපට්ඨානය කෙතෙක් දුරට වඩනවා ද යන කරුණයි. එබැවින් විශේෂයෙන් අප කිසියම් ආකාරයක මානසික දෙමනසක්, අසහනයක් අත්විඳිනවා නම් ඊට ප්‍රධානතම හේතුව සත්ත්වයා නිර්මාණය වූ ආකාරය පිළිබඳ සැබෑ තතු නොදැනීම් පිළිබඳ අවිද්‍යාවයි හෙවත් නොදැනීමයි. එනම් සත්ත්වයා හා ලෝකය පිළිබඳව දුක ඇතිවන හා නිරුද්ධ වන ආකාරය පිළිබඳ අනවබෝධයයි. සතර සතිපට්ඨානයෙන් අපට මග පෙන්වන්නේ සත්ත්වයා නිර්මාණය වූ ආකාරය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා දී ඊට ඇති ආශාව, බැඳීම නිරුද්ධ වන ආකාරයට සිහිය පිහිටුවා ගැනීමට නුවණ ලබාදීමයි. එහි දී සත්ත්වයා හෝ පුද්ගලයා නමින් අප ව්‍යවහාර කරන සිත-කය, නාමරූප - විඤ්ඤාණ, පංචඋපාදනස්කන්ධය, දෙළොස් ආයතන, අටලොස් ධාතු පිළිබඳ පැහැදිලි අවබෝධයක් අප වෙත ලබා දේ. එම අවබෝධය හෙවත් විද්‍යාව ලබා ගත් පමණට ලෝකය හෙවත් සත්ත්වයා පිළිබඳ අවබෝධය වර්ධනය වී දුකින් නිදහස් වීමට අවකාශ සැලසේ. බුදුදහමේ එන සියලු ඉගැන්වීම් මෙම සතර සතිපට්ඨානය තුළට අන්තර්ගත කිරීමේ හැකියාව පවතී.

සත්ත්වයාගේ සමස්ත අත්දැකීම් පිළිබඳව ම සිහිය පිහිටුවා ගත යුතු ස්ථාන සතරක් මහාසතිපට්ඨාන සූත්‍රයෙහි සඳහන් ව ඇත. ඇස්, කන්, නාසාදි ඉන්ද්‍රිය ඔස්සේ ලබන ආධ්‍යාත්මික හා බාහිර ලෝකය පිළිබඳ සියලු අත්දැකීම් මීට ඇතුළත් වේ.

එනම් :-

1. කයෙහි කය අනුව නුවණින් බලන කායානුපස්සනාව (*කායෙ කායානුපස්සී විහරති*)
2. වේදනාවන්හි වේදනා අනුව නුවණින් බලන වේදනානුපස්සනාව (*වේදනාසු වේදනානුපස්සී විහරති*)
3. සිතෙහි සිත අනුව නුවණින් බලන චිත්තානුපස්සනාව (*චිත්තේ චිත්තානුපස්සී විහරති*)
4. ධර්මයන්හි ධර්මයන් අනුව නුවණින් බලන ධම්මානුපස්සනාව (*ධම්මෙසු ධම්මානුපස්සී විහරති*)

යන අනුපස්සනා සතරයි.

සතර සතිපට්ඨානය වැඩීමේ ප්‍රතිඵල වශයෙන් ශ්‍රාවකයා තුළ සිහිය හා නුවණ යන අංග දෙක ම දියුණු විය යුතුය. සිහිය යනු සතියයි. නුවණ යනු සම්පජඤ්ඤය හෙවත් ප්‍රඥවයි. සතිය යනු යමෙකු එක් අතකින් ගොයම් මිටක් අල්ලා ගැනීම හා සමානයි. එම අනෙක් අතින් දෑකැත්තෙන් එම ගොයම් මිට කැපීම සම්පජඤ්ඤය හෙවත් ප්‍රඥවයි. බුදුදහමින් අපේක්ෂිත සැබෑ භාවනාව සඵල වන්නේ මෙම අංග දෙක ම මැනැවින් සම්පූර්ණ වීම් වශයෙනි. ඒ අනුව කාය, වේදනා, චිත්ත, ධම්ම යන ස්ථානයන්හි සිහිය පිහිටුවා ගැනීම සතිපට්ඨානයයි. එනම් චිත්ත භාවනාව හෙවත් සමථ භාවනාවයි. එලෙස සිහිය මැනැවින් පිහිටි පසු එම කායාදියෙහි හටගැනීම හා නිරෝධය දැකීම සතිපට්ඨාන භාවනාවයි. එනම් පඤ්ඤා භාවනා හෙවත් විපස්සනා භාවනාවයි.

**සූත්‍ර පිටකයේ දීඝ නිකායේ මහාසතිපට්ඨාන සූත්‍රයට අමතරව මජ්ඣිම නිකායේ සතිපට්ඨාන සූත්‍රයෙහි ද සංයුත්ත නිකායෙහි සතිපට්ඨාන සංයුත්තයෙහි ද අංගුත්තර නිකායෙහි සතිපට්ඨාන වග්ගයෙහි ද පටිසම්භිදාමග්ගයෙහි සතිපට්ඨාන කථාවෙහි ද අභිධර්ම පිටකයෙහි විභංගප්පකරණයෙහි සතිපට්ඨාන විභංගයෙහි ද සතිපට්ඨානය වැඩිය යුතු ආකාරය පිළිබඳ උපදෙස් ඇතුළත්ව ඇත. ඊට අමතරව විසුද්ධිමග්ගයෙහි හා අභිධම්මත්ථසංගහයෙහි ද මේ පිළිබඳ විස්තර වේ.** භාග්‍යවතුන් වහන්සේ සිය ශ්‍රාවකයන්ට ධර්ම දේශනා කිරීමේ දී සතිපට්ඨානයෙහි වැදගත්කම නිතර අවධාරණය කර තිබෙනු දක්නට ලැබේ. තථාගත දේශිත සෑම දහම් පදයක ම සතිපට්ඨානය හා සබැඳියාවක් පවතී. ප්‍රාණඝාතාදී පංචවිධ ශික්ෂා දුර්වලත්වය ප්‍රහීණ කරලනු සඳහා ද චක්ඛුවිඤ්ඤෙය්‍යාදි පංචකාමගුණයන්ගේ ප්‍රහාණය සඳහා ද කාමච්ඡන්දදි පංචනීවරණ ප්‍රහාණය සඳහා ද රූපූපාදනස්කන්ධ ආදි පංච උපාදනස්කන්ධයන්ගේ ප්‍රහාණය

සඳහා ද  නිරය ආදි පංචවිධ ගතීන්ගේ ප්‍රහාණය සඳහා ද  රූපරාග ආදි උද්ධම්භාගීය සංයෝජන ප්‍රහාණය සඳහා ද  සතර සතිපට්ඨානය වඩන ලෙස බුදුරජාණන් වහන්සේ අනුශාසනා කරති.

ජාතිය හෙවත් ඉපදීම ක්ෂය කොට නිවන් සාක්ෂාත් කිරීමේ මාවත දක්නා වූ ලොවට හිතවැඩ කැමැති භාග්‍යවතුන් වහන්සේ ඒ සඳහා ඒකායන මාවත වශයෙන් දේශනා කළේ සතර සතිපට්ඨානයයි. යමෙක් අතීතයෙහි කාමාදි චතුරෝඝය තරණය කළේ ද දැන් තරණය කරයි ද මතු තරණය කරන්නේ ද ඒ සැවොම මෙම සතිපට්ඨාන මාවතින් ම එය කළාහු ය.

*'ඒකායනං ජාතික්ඛයන්තදස්සී මග්ගං පජානාති හිතානුකම්පී,*

*ඒතෙන මග්ගෙන අතරිංසු පුබ්බෙ තරිස්සන්ති යෙ ච තරන්ති ඔඝන්ති.'*

# සතිපට්ඨානය - සතිපට්ඨානභාවනාව - සතිපට්ඨානභාවනාගාමිනීපටිපදාව

සංයුත්ත නිකායේ සතිපට්ඨාන සංයුත්තයේ **විභංග සූත්‍රයට** අනුව සතිපට්ඨාන භාවනාවට සම්බන්ධ කරුණු තුනක් පැහැදිලි කර තිබේ. ඒ අනුව සතිපට්ඨානය, සතිපට්ඨානභාවනාව, සතිපට්ඨානගාමිනීපටිපදාව යනු ඒ කරුණු තුනයි. එහි '**සතිපට්ඨාන**' යනුවෙන් දක්වෙන්නේ කායානුපස්සනා වේදනානුපස්සනා චිත්තානුපස්සනා හා ධම්මානුපස්සනා යන හතරයි. එනම් කය, වේදනා, සිත, ධම්ම යන ස්ථාන සතරෙහි සිහිය පිහිටුවා ගැනීමයි. '**සතිපට්ඨාන භාවනාව**' යනු කාය, වේදනා, චිත්ත, ධම්ම යන සතරෙහි හටගැනීම (සමුදයධම්මානුපස්සී විහරති) හා නිරුද්ධවීම (වයධම්මානුපස්සී විහරති) අනිත්‍ය සිද්ධාන්තයට අනුව මෙනෙහි කිරීමයි. සම්මාදිට්ඨිය පෙරටු කොටගත් ආර්යඅෂ්ටාංගික මාර්ගය දක්වා ඇත්තේ '**සතිපට්ඨානභාවනාගාමිනී පටිපදාව**' වශයෙනි. එනම් සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි යන අංග අටෙන් යුතු දුක නිවන මගයි. ඉහත දැක්වූ අංග තුන ම නිවන සඳහා සතර සතිපට්ඨානය වඩන්නා තුළ තිබිය යුතු ලක්ෂණයන් ය.

## පටිච්චසමුප්පාදය හා ජීවිතාවබෝධය

සතිපට්ඨානය නිසි ලෙස ප්‍රගුණ කිරීමටත් එමගින් මැනැවින් දුකින් නිදහස් වීමටත් අවකාශ ලැබෙන්නේ බුදුරදුන් දේශනා කළ පරිදි පටිච්චසමුප්පාදය තේරුම් ගැනීමෙනි. බුදුදහමේ ඇතුළත් සුවිශේෂී ඉගැන්වීම අන්තර්ගත වන්නේ පටිච්ච සමුප්පාද විග්‍රහය තුළයි. 'පටිච්චසමුප්පාද', 'අරියඤාය' (අනාථපිණ්ඩික සුත්ත, සං.නි. 2, 212 පිට), 'ඉදප්පච්චයතා' (මහානිදාන සුත්ත, දී.නි.2, 80), 'උදයබ්බයගාමී පඤ්ඤා' (ව්‍යග්ඝපජ්ජ සුත්ත), 'අනිච්චතා' ආදි විවිධ නම්වලින් මෙම න්‍යාය බුදුදහමෙහි විස්තර කොට තිබේ. භාග්‍යවතුන් වහන්සේ පස්වග මහණුන්ට *'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මං...'* යනුවෙන් දේශනා කළේ ද, බාහිර දරුචීරියට *'දිට්ඨෙ දිට්ඨමත්තං සුතෙ සුතමත්තං මුතෙ මුතමත්තං විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං....'* යනුවෙන් පැහැදිලි කළේ ද, අනාථපිණ්ඩික සිටුතුමාට *'ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාද ඉදං උප්පජ්ජති....'* යනුවෙන් දේශනා කළේ ද, *'ඉති ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති.... '* යනුවෙන් දක්වෙන්නේ ද අස්සජි මහරහතන් වහන්සේ වහන්සේ *'යෙ ධම්මා හේතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ....'* යනුවෙන් උපතිස්ස පරිබ්‍රාජකයාට දේශනා කළේ ද *'අවිජ්ජා පච්චයා සංඛාරා සංඛාර පච්චයා විඤ්ඤාණං.... '* ආදි වශයෙන් දක්වෙන්නේ ද මෙම එක ම අනුශාසනයයි. මෙය තේරුම් ගත් පමණට දුකෙහි හටගැනීම හා නිරෝධය පිළිබඳ වූ චතුරාර්ය සත්‍යය පිළිබඳ අවබෝධය දියුණු වේ. විශේෂයෙන් සත්ත්වයා නිර්මාණය වී ඇති ස්කන්ධ, ධාතු, ආයතන, නාමරූප පිළිබඳ දැනුම පිරිසිදු වේ. එපමණට දුකින් නිදහස්වීමේ ඒකායන මාවත වූ සතර සතිපට්ඨානයට අනුව ජීවත්වීමේ උනන්දුවක් හටගනී.

සතර සතිපට්ඨානය තුළ වාසය කළ පමණට අපා දුකින් මෙන් ම සසර දුකින් ද නිදහස් වීමට අවස්ථාව ලැබේ. මෙලොව උපත ලැබූ අයෙකුට ලද හැකි උසස් ම රැකවරණය වන්නේ සතර සතිපට්ඨානයයි.

දිනක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ ආනන්ද මාහිමියන් වහන්සේ පටිච්චසමුප්පාදය ගැඹුරු ඉගැන්වීමක් බවත් එහෙත් එය අවබෝධ කර ගැනීම අපහසු නොවන බව සඳහන් කළහ. මෙහි දී භාග්‍යවතුන් වහන්සේ අනඳ මාහිමියන්ට දේශනා කළේ ආනන්ද එසේ නොපවසන ලෙසයි. සත්ත්වයන් සසර බොහෝ කලක් අවිද්‍යා - තෘෂ්ණා දූලට හසු වී පැටලී මෙලෙස ගමන් කරන්නේ මෙම ආර්ය න්‍යාය අවබෝධ කර නොගැනීම නිසා බව අවධාරණය කළහ (මහානිදාන සූත්ත, දී.නි.2, 80).

භාග්‍යවතුන් වහන්සේ පටිච්ච සමුප්පාදය විවිධාකාරයෙන් දේශනා කර ඇති ආකාරය ත්‍රිපිටකය විමසා බැලීමෙන් පැහැදිලි වේ. කුමන ආකාරයෙන් එය විස්තර කළ ද එහි ඇති සාරය නොහොත් සැකැස්ම සමාන වූවකි. සංයුත්ත නිකායේ සෝතාපත්ති සංයුත්තයේ සඳහන් තතිය අනාථපිණ්ඩික සූත්‍රයෙහි පටිච්චසමුප්පාදයේ මෙම මූලධර්මය විස්තර කර තිබේ.

*'කතමො චස්ස අරියො ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො? ඉධ ගහපති, අරියසාවකො පටිච්චසමුප්පාදං යෙව සාධුකං යොනිසො මනසිකරොති, 'ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාද ඉදං උප්පජ්ජති, ඉති ඉමස්මිං අසති ඉදං න හොති ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති.'*

කවර නම් ආර්ය න්‍යායක් ශ්‍රාවකයකු විසින් ප්‍රඥාවෙන් මැනැවින් දැක්ක යුතු ද යන්න මෙහි දැක්වේ. ඒ අනුව පටිච්චසමුප්පාදය මනා කොට නුවණින් මෙනෙහි කළ යුතු බව අවධාරණය කර තිබේ. එනම් මෙලෙස හේතු ඇති කල්හි මෙම ප්‍රතිඵලය වේ. මෙය හටගැනීමෙන් මෙය උපදී. මෙය නැති කල්හි මෙය නොවේ. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ. පටිච්ච සමුප්පාදය න්‍යාය විස්තර කෙරෙන සංක්ෂිප්ත පැහැදිලිකිරීම මෙයයි. එය ම 'අවිජ්ජා පච්චයා සංඛාරා ... '. ආදි වශයෙන් අංග දෙළහකින් යුතුව මධ්‍යම වශයෙන් ද 'හේතු, ආරම්මණ අධිපති.... ' ආදි වශයෙන් සූවිසිප්‍රත්‍ය ක්‍රමයට විස්ථාරිත වශයෙන් ද මෙය දේශනා කොට තිබේ. ශ්‍රාවකයන්ගේ බුද්ධියේ පමණට භාග්‍යවතුන් වහන්සේ මෙලෙස විවිධාකාරයෙන් පැහැදිලි කොට තිබේ. පටිච්චසමුප්පාදය තේරුම් ගත් පමණට අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණ අවබෝධ වනු ඇත.

බුද්ධශාසනයට යමකු සැබෑ ලෙස ස්ථාවරව බැස ගන්නේ බුදුසසුනට ම ආවේණික වූ ලෝක යථාර්ථය නිවැරදි ලෙස ශ්‍රවණය කිරීම් වශයෙනි. එනම් හේතු ඇති කල්හි පෙර නොතිබී හටගන්නා ලෝකය හේතු නිරුද්ධ වීමෙන් ඉතිරි නැතිව නිරුද්ධ වන බව පිළිබඳ යථාර්ථයයි (අහුත්වා සම්භූතං හුත්වා න භවිස්සති). අවිද්‍යාව ඇති කල්හි ලෝකයක් ඇතැයි නිර්මාණය කර ගන්නා අතර අවිද්‍යාව නැති කල්හි අවිද්‍යාවෙන් හටගත් ලෝකය ද නිරුද්ධ වේ. අතීත කර්මවිපාක වශයෙන් වර්තමානයෙහි නිර්මාණය වන පංචස්කන්ධ ලෝකය නුවණින් නොදකීම නිසා ඒ අරභයා චේතනා (පුඤ්ඤ, අපුඤ්ඤ, ආනෙඤ්ජ වශයෙන් සංස්කාර) නිර්මාණය වුවහොත් පංචුපාදනස්කන්ධ ගොඩනැඟී ඊට අනුගතව සෙසු අංග නිර්මාණය වී දුක හටගන්නා ආකාරය අනුපිළිවෙළින් මෙලෙස විස්තර කර ඇත. ඒ අනුව

*'අවිජ්ජාපච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සෝ, ඵස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණසෝකපරිදේව දුක්ඛදෝමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අයං වුච්චති භික්ඛවෙ පටිච්චසමුප්පාදෙ.'* (පටිච්චසමුප්පාද සූත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 02 පිට)

මෙලෙස අවිද්‍යා සහගතව හටගන්නා ලෝකය නිසා ජරාමරණාදි දුක් සමුදය නිර්මාණය වේ.

යමෙකු මෙහි යථා ස්වභාවය දැන අවිද්‍යාව ඉතිරි නැතිව හට නොනැගෙන අයුරින් සිහිනුවණින් (සතිසම්පජඤ්ඤයෙන්) යුතුව වාසය කළහොත් ජරාමරණ සංඛ්‍යාත ලෝකයක් ද නිර්මාණය නොවනු ඇත. එමඟින් ජරාමරණාදි දුක් සමුදයයෙන් සපුරා නිදහස්වීමට ද අවස්ථාව උදා වේ. එය මෙලෙස විස්තර වේ.

*'අවිජ්ජායත්වේව අසේසවිරාගනිරෝධා සංඛාර නිරෝධෝ සංඛාර නිරෝධා විඤ්ඤාණ නිරෝධෝ විඤ්ඤාණ නිරෝධා නාමරූප නිරෝධෝ නාමරූප නිරෝධා සළායතන නිරෝධෝ සළායතන නිරෝධා ඵස්ස නිරෝධෝ ඵස්ස නිරෝධා වේදනා නිරෝධෝ වේදනා නිරෝධා තණ්හා නිරෝධෝ තණ්හා නිරෝධා උපාදන නිරෝධෝ උපාදන නිරෝධා භව නිරෝධෝ භව නිරෝධා ජාති නිරෝධෝ ජාති නිරෝධා ජරාමරණසෝකපරිදේව දුක්ඛ දෙමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමේතස්ස කේවලස්ස දුක්ඛන්ධස්ස නිරෝධෝ හොති' අයමස්ස අරියෝ ඤායෝ පඤ්ඤය සුදිට්ඨෝ හෝති සුප්පවිද්ධෝ'.*

අවිද්‍යාව ඉතිරි නැතිව නිරෝධ කිරීම ජරාමරණාදි සියලු දුක්වල නිරෝධය වේ. මෙලෙස දුකෙහි හටගැනීම හා නිරෝධය පිළිබඳ ආර්ය න්‍යාය වූ පටිච්චසමුප්පාදය මැනැවින් අවබෝධ කර ගැනීම සෝතාපන්න වීමේ මාවතයි. යමෙක් බිය හා වෛරය ගෙනදෙන පංච දුශ්චරිතයන් දුරු කළේ වේද සතර සෝතාපත්ති අංගයන්ගෙන් යුක්ත වූයේ ද ඉහත දැක්වූ ආර්ය න්‍යාය දක්නේ වේ ද ඔහු ක්ෂය කළ නිරය ඇත්තේ (*ඛීණනිරයයොම්හි*) වෙමියි ද, ක්ෂය කළ තිරිසන් දුගති විපාක ඇත්තේ වේ ද (*ඛීණතිරච්ඡානයෝනියෝ*), ක්ෂය කළ ප්‍රේත විෂය ඇත්තේ ද (*ඛීණපෙත්තිවිසයො*), ක්ෂය කළ දුගතිපාක ඇත්තේ ද (*ඛීණාපායදුග්ගතිවිනිපාතො*), සෝවාන් වූයෙම් (*සෝතාපන්නෝහමස්මි*), පහළට නොවැටෙන ස්වභාවයෙන් යුක්ත වූයේ (*අවිනිපාතධම්මෝ*), නියත වශයෙන් සම්බෝධිපරායණ වූයේ (*නියතෝ සම්බෝධිපරායණො*) වෙමි'යි පවසන්නේ ය.

ඉහත පාඨයෙන් ඉතා පැහැදිලි වන යථාර්ථය නම් බිය - වෛරය ගෙන දෙන කරුණුවලින් මිදීමටත් සතර අපායෙන් නිදහස් වීමටත් සෝතාපන්න වීමටත් හේතුවන ප්‍රධාන සාධකය පටිච්ච සමුප්පාදය ඔස්සේ දුක අවබෝධ කර ගැනීම බවයි. මෙම අවබෝධයත් සමග සතර සෝතාපත්ති අංගයන්හි ස්ථාවර ව බැස ගනී. එනම් බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන කෙරෙහි ස්ථාවරව නොසෙල්වෙන ප්‍රසාදය සහ ආර්ය කාන්ත ශීලයෙන් මන්විත වීමයි. ආර්ය උතුමන් විසින් අගය කළ පංචසීල මෙහි දී පිහිටා සිටී. බිය හා වෛරය දුරු කොට සතර අපායෙන් නිදහස්වීමේ ඒකායන මාවත මෙයයි. පටිච්ච සමුප්පාදය මැනැවින් අවබෝධ කර ගැනීම ඇත - නැත අන්තයන්ගෙන් දුරුවීමටත් චතුරාර්ය සත්‍යය වටහා ගැනීමටත් ඒ ඔස්සේ මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරමින් ස්කන්ධ, ධාතු, ආයතන, නාමරූප ආදි ජීවිත යථාර්ථ පිරිසිඳ දැන ගැනීමටත් අවස්ථාව උදාවේ. එබැවින් පටිච්ච සමුප්පාදය අවබෝධ කර ගැනීමට බුදුදහමට අනුව සුගතිය හා විමුක්තිය සාක්ෂාත් කර ගැනීමේ මූලික පදනම ලෙස සඳහන් කළ හැකි ය. මෙලෙස පටිච්ච සමුප්පාදය තේරුම් ගැනීමට සසරගත පුණ්‍ය මහිමයක් මෙන් ම නුවණැතිබව, අවංකබව හා සුවචබව යන ගුණාංග තමා තුළ තිබීම අත්‍යවශ්‍ය වේ. මෙහිලා කල්‍යාණ මිත්‍ර ආශ්‍රය සුවිශාල කාර්යභාරයක් ඉටු කරයි.

පටිච්ච සමුප්පාදය වටහා ගැනීම ධර්මය වටහා ගැනීමට අන්‍යොන්‍ය වශයෙන් උපකාරවත් වේ. ධර්මය තේරුම් ගැනීම බුදුරජාණන් වහන්සේ කවරෙක් ද යන්න අවබෝධ කර ගැනීමට ද උපකාරවත් වනු ඇත.

*'යො පටිච්චසමුප්පාදං පස්සති සො ධම්මං පස්සති, යො ධම්මං පස්සති සො පටිච්චසමුප්පාදං පස්සති.'*

යමෙක් පටිච්චසමුප්පාදය දකියි ද ඔහු ධර්මය දකියි. යමෙක් ධර්මය දකියි ද ඔහු පටිච්චසමුප්පාදය දකියි.

(මහාහත්ථිපදෙපම සුත්ත, ම.නි.1, 460 පිට)

*'යො ධම්මං පස්සති සො මං පස්සති, යො මං පස්සති සො ධම්මං පස්සති.'*

යමෙක් ධර්මය දකියි ද ඔහු මා (බුදුරදුන්) දකියි. යමෙක් බුදුරදුන් දකියි ද ඔහු ධර්මය දකියි.

'ඇත - නැත' යන අන්තයන්ගෙන් දුරුව මධ්‍ය මාර්ගය නිසි ලෙස මුණ ගැසෙන්නේ පටිච්චසමුප්පාද න්‍යාය මැනැවින් ශ්‍රවණය කිරීමෙනි. හේතු එක්වීම් වශයෙන් ස්කන්ධ පංචකයේ හටගැනීම (සමුදය) දකින්නා 'නැත' යන උච්ඡේද අන්තයෙන් (දෘෂ්ටියෙන්) මිදේ. හේතු නිරුද්ධවීමෙන් ස්කන්ධ පංචකයේ වැයවීම (වය=නිරෝධය) දකින්නා 'ඇත' යන ශාශ්වත අන්තයෙන් ද මිදේ. මෙලෙස සම්මාදිට්ඨිය

උපදවා ගෙන 'ඇත සහ නැත' යන අන්ත දෙකින් ම එකවර නිදහස්වීමට අවස්ථාව ලැබෙන්නේ පටිච්ච සමුප්පාදය නම් වූ ආර්ය න්‍යාය නිවැරදි ලෙස අසා දැන ගැනීමෙනි (කච්චානගොත්ත සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 28 පිට). තව ද සැබෑ ලෙස ධර්මකථිකයකු බවට පත් විය හැක්කේ ද මෙම ආර්ය න්‍යාය මැනැවින් දේශනා කිරීම් වශයෙනි (ධම්මකථික සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 28 පිට). *'දිට්ඨිං ච අනුපගම්ම සීලවා...'* යනුවෙන් දැක්වෙන පරිදි දෘෂ්ටීන්ට නොපැමිණ (කරණීය-මෙත්ත සුත්ත) සීලයට පැමිණිය හැක්කේ පටිච්චසමුප්පාද න්‍යාය තේරුම් ගැනීමේ ප්‍රතිඵල වශයෙනි.

පළමුව පටිච්චසමුප්පාදය පිළිබඳ කල්‍යාණ මිත්‍ර ඇසුරින් සුතමය ඤාණය ලබා ඉන්පසු එය හැකිතාක් දුරට නුවණින් මෙනෙහි කිරීම් වශයෙන් චින්තාමය ඤාණය දියුණු කර ගනිමින් සතර සතිපට්ඨානය තුළ පිහිටා සීල සමාධි පඤ්ඤා වර්ධනය කර ගැනීම් වශයෙන් භාවනාමය ඤාණය ඇති කර ගැනීම අවශ්‍ය වේ.

'අවිජ්ජා පච්චයා සංඛාරා...' ආදි වශයෙන් විස්තර කෙරෙන පටිච්චසමුප්පාදයේ අංග දෙළොස ආරෝහණ ක්‍රමයට ද අවරෝහණ ක්‍රමයට ද හටගන්නා ක්‍රමයට ද නිරුද්ධ කරන ක්‍රමයට ද විස්තර කර තිබෙනු දක්නට ලැබේ. භාග්‍යවතුන් වහන්සේ චතුරාර්ය සත්‍යාවබෝධයේ දී (උදානපාලියෙහි බෝධිවග්ගයෙහි සඳහන් පරිදි) අවිද්‍යාවේ පටන් ක්‍රමයෙන් දුක හටගන්නා ආකාරය දක්වා තිබෙන අතර ශ්‍රාවකයන්ට එය සත්‍ය ගවේෂණයක් ලෙස පැහැදිලි කිරීමේ දී (විභංග-සං.නි.අභිසමය සංයුත්ත, 2, 4 පිට ආදි සූත්‍රයන්ට අනුව) ජරාමරණාදි වශයෙන් දැනට පෙනෙන දුකෙහි පටන් නොපෙනෙන අවිද්‍යාව දක්වා විස්තර කර තිබෙනු දක්නට ලැබේ.

**ජරා** - ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙහි යම් දිරීමක්, දිරෙන බවක්, දත්වැටීම්, කෙස් පැසීම්, ඇඟ රැලි වැටීම්, ආයු පිරිහීම්, ඉඳුරන්ගේ පැසීම් ආදියක් වේ ද මෙය 'ජරා' නම් වේ.

**මරණ** - ඒ ඒ සත්ත්ව නිකායෙන් ඒ ඒ සත්ත්වයන්ගේ යම් චෙන්වීමක්, බිඳීමක්, අතුරුදහන් වීමක්, මච්චු නම් වූ මරණයක් කාලක්‍රියාවක් ස්කන්ධයන්ගේ බිඳියාමක්, සිරුර හැර දැමීමක්, ජීවිතින්ද්‍රියේ සිඳී යාමෙක් වේ ද මෙය 'මරණ' නම් වේ. ජරාමරණයන්ට හේතුව ජාතිය (උපත) වන අතර ජාති නිරෝධයෙන් ජරාමරණ නිරෝධය සිදු වේ.

**ජාති** - කිසියම් භාවයක උපත ලැබීම, හටගැනීම, බැස ගැනීම, ස්කන්ධයන්ගේ පහළවීම, ආයතනයන්ගේ හටගැනීම ජාති නම් වේ. ජාතියට හේතුව භවය හෙවත් උපතක් පිණිස කර්ම සකස්වීමයි. ජාතිය නිරුද්ධ කිරීමට හැකි වන්නේ භවය නිරුද්ධ කිරීමෙනි.

**භව** - ලෝකයක් ඇති බවට සිතෙන ස්වභාවය 'භව' නම් වේ. ඒ අනුව කාමභව, රූපභව, අරූපභව වශයෙන් ත්‍රිවිධාකාරයෙන් ලෝකයක් මුණ ගැසේ. මේ තුනේ ම සිටීම සංසාර චක්‍රය තුළ ම සැරිසැරීමකි. බුදුරදුන් ධර්මය දේශනා කළේ මේ ත්‍රිවිධ භවයෙන් ම නිදහස්වීමටයි. භවයට හේතුව උපාදාන වන අතර උපාදාන නිරුද්ධ කිරීමෙන් භව නිරෝධය සිදු වේ.

**උපාදාන** - තමා වෙත ඇද - බැඳ තබා ගන්නා ස්වභාවය 'උපාදානයි'. මෙය කාම උපාදාන, දිට්ඨි උපාදාන, සීලබ්බත උපාදාන, අත්තවාද උපාදාන වශයෙන් සිව් වැදෑරුම් වේ. උපාදානයන්ට හේතුව තණ්හාව වන අතර තණ්හා නිරුද්ධ කිරීමෙන් උපාදාන නිරුද්ධ වේ.

**තණ්හා** - යමකට සිත ඇලීම, බැස ගැනීම 'තණ්හාවයි'. මෙය ඇස ආදි ඉන්ද්‍රියයන්ට රූපාදි අරමුණු අරභයා සිදු වේ. ඒ අනුව රූපතණ්හා, ශබ්දතණ්හා, ගන්ධතණ්හා, රසතණ්හා, ඵොට්ඨබ්බතණ්හා, ධම්මතණ්හා වශයෙන් සයාකාර වේ. තණ්හාවට හේතුවන වේදනාව වන අතර වේදනා නිරුද්ධ කිරීමෙන් තණ්හාව ද නිරුද්ධ වනු ඇත.

**වේදනා** - සැප දුක් උපේක්ෂා වශයෙන් විඳ ගන්නා ස්වභාවය 'වේදනා' නම් වේ. මෙය කයක් (වේදනාකාය) වශයෙන් දැක්වෙන අතර ඇස ආදි ස්පර්ශයන් විෂයයෙහි වේදනා හටගනී. ඒ අනුව වේදනාව ද සයාකාර වේ. එනම් චක්ඛුසම්ඵස්සජා වේදනා, සෝතසම්ඵස්සජා වේදනා, ඝාණසම්ඵස්සජා වේදනා,

ජිව්හාසම්ඵස්සජා වේදනා, කායසම්ඵස්සජා වේදනා, මනෝසම්ඵස්සජා වේදනා වශයෙනි. වේදනාවට හේතුව ඵස්සය වන අතර ඵස්ස නිරුද්ධ කිරීමෙන් වේදනා ද නිරුද්ධ කිරීමට හැකියාව ලැබේ.

**ඵස්ස** - ඇස ආදි ඉන්ද්‍රියයන්ට රූපාදි අරමුණු ආපාතගත වීම 'ඵස්ස' = ස්පර්ශ නම් වේ. ඇස ආදි ඉන්ද්‍රිය ඔස්සේ රූපාදි අරමුණු විෂයයෙහි විඤ්ඤාණය පහළ වූ කල්හි ස්පර්ශය හටගනී. ඒ අනුව ස්පර්ශය ද සයාකාර වේ. එනම් චක්ඛුසම්ඵස්සය, සෝතසම්ඵස්සය, ඝාණසම්ඵස්ස, ජිව්හාසම්ඵස්සය, කායසම්ඵස්සය, මනෝසම්ඵස්සය වශයෙනි. ඵස්සයට හේතුව සළායතන වන අතර සළායතන නිරුද්ධ කිරීමෙන් ඵස්සය ද නිරුද්ධ වේ.

**සළායතන** - රූපාදි අරමුණු නිපදවන ඇස ආදි ආයතන හය 'සළායතන' = ෂඩායතන නමින් හැඳින්වේ. එම ආයතන හය නම් චක්ඛායතන, සෝතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, මනායතන වශයෙනි. සළායතනයන්ට හේතුව නාමරූප වන අතර නාමරූප නිරුද්ධ කිරීමෙන් සළායතන නිරෝධය ද සිදු වේ.

**නාමරූප** - 'නාම' යන වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර යන පහයි. 'රූප' යනු පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහාභූත සහ චක්ඛු, සෝතාදි උපාදාය රූප විසිහතරයි. නාමරූපයන්ට හේතුව විඤ්ඤාණය වන අතර විඤ්ඤාණ නිරුද්ධ කිරීමෙන් නාමරූප ද නිරුද්ධ වේ.

**විඤ්ඤාණ** - යමක් දැන ගන්නා ස්වභාවය 'විඤ්ඤාණ' = විඥාන නම් වේ. ඇස ආදි ඉන්ද්‍රිය ඔස්සේ මෙම දැන ගැනීම සිදු කෙරෙන බැවින් මෙය එම ආයතනයන්ගේ නමින් දක්වා හයාකාර වශයෙන් විස්තර කර තිබේ. එනම් චක්ඛුවිඤ්ඤාණ, සෝතවිඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හාවිඤ්ඤාණ, කායවිඤ්ඤාණ, මනෝවිඤ්ඤාණ වශයෙනි. විඤ්ඤාණයට හේතුව සංඛාර වන අතර සංඛාර නිරෝධයෙන් විඤ්ඤාණය ද නිරුද්ධ වනු ඇත.

**සංඛාර** - විතර්කනය කිරීම හෙවත් සිතිවිලි 'සංඛාර' = සංස්කාර නමින් ව්‍යවහාර කෙරේ. අවිද්‍යාව නිසා හටගන්නා මෙම සංඛාර 'කායසංඛාර, වචීසංඛාර, චිත්තසංඛාර' වශයෙන් තුන් ආකාර වේ. තවත් න්‍යායකට අනුව මෙය පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසංඛාර, ආනෙඤ්ජාභිසංඛාර වශයෙන් ද දක්වා තිබේ. සංඛාරයට හේතුව, ආහාරය හෙවත් නිදානය වශයෙන් දක්වා ඇත්තේ අවිද්‍යාවයි. අවිද්‍යාව ඇති කල්හි සංඛාර හටගන්නා අතර අවිද්‍යා නිරෝධයෙන් සංඛාර නිරුද්ධ වේ.

**අවිජ්ජා** - ලෝකය හෙවත් දුකෙහි හටගැනීම හා නිරෝධය නොදන්නා ස්වභාවය 'අවිජ්ජා' = අවිද්‍යා නම් වේ. එනම් දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යන චතුරාර්ය සත්‍යය නැතහොත් පටිච්චසමුප්පාදය නොදන්නා බවයි. අවිද්‍යාවට හේතුව වශයෙන් දක්වා ඇත්තේ ආස්‍රවයි. ආස්‍රවයට හේතුව අවිද්‍යාවයි. මෙය දෙක අන්‍යොන්‍ය වශයෙන් ක්‍රියාත්මක වේ.

මේ අනුව අවිද්‍යාව ඇති කල්හි සංඛාර (චේතනා) හටගනී. සංඛාර ඇති කල්හි විඤ්ඤාණ හටගනී. විඤ්ඤාණ ඇති කල්හි නාමරූප හටගනී. නාමරූප ඇති කල්හි සළායතන හටගනී. සළායතන ඇති කල්හි ඵස්ස හටගනී. ඵස්ස ඇති කල්හි වේදනා හටගනී. වේදනා ඇති කල්හි තණ්හා හටගනී. තණ්හා ඇති කල්හි උපාදාන හටගනී. උපාදාන ඇති කල්හි භව හටගනී. භව ඇති කල්හි ජාති හටගනී. ජාති ඇති කල්හි ජරාමරණාදි දුක් සමුදය හටගනී. මෙලෙස දුක හටගන්නා අතර අවිද්‍යාව නැති කල්හි සංඛාර, විඤ්ඤාණ, නාමරූපාදි අංග හටනොගන දුකින් නිදහස් වේ (විභංග සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 4-6 පිටු). මේ සඳහා ඇති මාවත වශයෙන් දක්වා ඇත්තේ සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මසති, සම්මාසමාධි වශයෙන් දැක්වෙන ආර්ය අෂ්ටාංගික මාර්ගයයි (ඤාණවත්ථු සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 88-90 පිට).

තව ද 'අවිජ්ජා පච්චයා සංඛාරා ...' ආදි වශයෙන් දැක්වෙන දුකෙහි හටගන්නා ප්‍රතිපදාව මිථ්‍යා ප්‍රතිපදාව ලෙසත් 'අවිජ්ජායත්වේව අසේසවිරාගා නිරෝධා සංඛාර නිරෝධෝ .... ' ආදි වශයෙන් දැක්වෙන දුක නිරුද්ධ කරන ප්‍රතිපදාව සම්‍යග් ප්‍රතිපදාව වශයෙන් ද දක්වා තිබේ (පටිපදා සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 8

පිට). අවිද්‍යාදි හේතු ඇති කල්හි දුකෙහි හටගැනීමත් අවිද්‍යාවේ නිරෝධයෙන් දුකෙහි නිරෝධයත් තේරුම් ගැනීමේ ප්‍රතිඵල වශයෙන් සත්ත්ව පුද්ගල දෘෂ්ටියට නොවැටී හේතුඵල සිද්ධාන්තය මැනැවින් තේරුම් ගැනීමට හැකියාව ලැබේ. එවිට මේ දුක තමා විසින් නිර්මාණය කරන ලද්දක් හෝ අනෙකකු විසින් නිර්මාණය කරන ලද්දක් හෝ වශයෙන් දෘෂ්ටියකට නොපැමිණේ. හේතු ඇති කල්හි දුක හටගෙන හේතු නිරුද්ධ වීමෙන් දුක නිරුද්ධ වන බව ප්‍රත්‍යක්ෂ වේ (අචේලකස්සප සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 30 පිට). මේ අවබෝධයත් සමඟ තමා අතීතයේ සිටියා ද නැද්ද අනාගතයෙහි සිටින්නේ ද නැද්ද ආදි සියලු මතවාද සමනය වේ (පච්ච සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 42 පිට). තව ද තමාගේ සිත - කය තමා විසින් කරන ලද්දක් හෝ අනෙකකු විසින් කරන ලද්දක් හෝ නොව හේතුඵල සිද්ධාන්තය මත නිර්මාණය වූවක් ය යන අවබෝධය ද මෙමගින් පසක් වේ (නතුම්හ සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 100 පිට).

දුකෙහි හටගැනීම හා නිරෝධය පිළිබඳ මෙම සුවිශේෂී අවබෝධය අප ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේට මෙන් ම විපස්සී, සිඛී, වෙස්සභූ, කකුසඳ, කෝනාගමනන, කස්සප යන පෙර වැඩ සිටි බුදුරජාණන් වහන්සේලාට ද ඒ අයුරින් අවබෝධ වූ ආකාරය විස්තර වේ. එපමණක් නොව ලොව පහළ වන සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලා අවබෝධ කර ගන්නා ප්‍රධාන කරුණ ද මෙයයි. එබැවින් පෙර බුදුවරුන් ද ප්‍රත්‍යක්ෂ කළ පටිච්චසමුප්පාද සංඛ්‍යාත මෙම මාවත පුරාණ මාවතක් වශයෙන් විස්තර කර තිබේ (නගර සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 162 පිට).

පටිච්චසමුප්පාදයේ දැක්වෙන අවිජ්ජාදි අංග එක් චිත්තක්ෂණයක් තුළට මෙන් ම අතීත - වර්තමාන - අනාගත යන කාලත්‍රයට ද ගොනු කළ හැකිය. කාලත්‍රයට අනුව පටිච්චසමුප්පාදය විස්තර කිරීමේ දී අතීත හේතු, වර්තමාන ඵල, වර්තමාන හේතු, අනාගත ඵල වශයෙන් සතරාකාරයකට විස්තර කර තිබේ.

| | | |
|---|---|---|
| අතීත හේතු | - | අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව |
| වර්තමාන ඵල | - | විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා |
| වර්තමාන හේතු | - | අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව |
| අනාගත ඵල | - | විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා |

අතීතයේ පැවැති අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව යන හේතුවලට අනුරූපව වර්තමාන ජීවිතය හෙවත් විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන ස්කන්ධ පංචකයක් නිර්මාණය වේ. අප ඇස, කණ ආදි ඉන්ද්‍රිය ඔස්සේ රූප, ශබ්දාදි අරමුණු මුලින් ස්පර්ශ කිරීමේ දී හටගන්නේ මෙයයි. මෙය ලෝභ, දෝස, මෝහ යන හේතුන්ගෙන් තොර වූවකි. එය ඇතැම් තැනෙක දුක්ඛ සත්‍යය වශයෙන් ද දක්වා තිබේ. මෙම ස්කන්ධ පංචකය අවිද්‍යාදි අනුසය ඇතිව ස්පර්ශ කළ විට වර්තමාන හේතු නිර්මාණය වේ. එනම් ස්කන්ධ පංචකය ම පංචුපාදානස්කන්ධයක් බවට පරිවර්තනය කර ගනී. මෙලෙස අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව යන හේතු පහළ කළ හොත් අනාගතය නිර්මාණය වේ. එවිට විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන ඵලයන් භුක්ති විඳීමටත් දුක ස්පර්ශ කිරීමටත් සිදු වේ. එක චිත්තක්ෂණයක් තුළ වුව ද මෙම අංග සියල්ලෙහි සම්බන්ධය විස්තර කළ හැකි ය. එනම් මධුපිණ්ඩික සූත්‍රයෙහි දැක්වෙන පරිදි අවිද්‍යා සහගතව ඇස උපන් කල්හි රූපය, චක්ඛු විඤ්ඤාණ, චක්ඛු සම්ඵස්සය ආදි අංග ගොඩනැඟී ප්‍රපංච නිර්මාණය වේ. ලෝකයා දුක තුළ වාසය කරයි 'දුක්ඛෙ ලෝකො පතිට්ඨිතො... යනුවෙන් දැක්වෙන්නේ අවිද්‍යා සහිත ලෝකයා දුක තුළ වාසය කරන ආකාරයයි. සංසාරය නිර්මාණය වන්නේ මේ අයුරිනි. එමෙන් ම අවිද්‍යාවෙන් තොරව ඇස, රූපාදි කරුණු ස්පර්ශ නොකළ හොත් ප්‍රපංච ගොඩනොනැඟී දුකින් නිදහස්වීමට ද අවස්ථාව උදාවේ. මෙම සංසාරයෙන් මිදිය හැක්කේ මෙම සිද්ධාන්තය මැනැවින් තේරුම් ගෙන සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂාවෙහි අඛණ්ඩව නියැළීමෙහි ප්‍රතිඵල වශයෙනි. එහි ප්‍රතිඵල වශයෙන් සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රිය ධර්ම පරිපූර්ණත්වයට පත් වේ.

### විඤ්ඤාණ - නාමරූප සම්බන්ධය

පටිච්චසමුප්පාදයේ අංග එකිනෙකට දම්වැලක් සේ සම්බන්ධව පවතී. අවිද්‍යාව සංස්කාරයටත් සංස්කාරය අවිද්‍යාවටත් .... ආදි වශයෙනි. ඒ අතර විඤ්ඤාණ - නාමරූප දෙකෙහි සම්බන්ධය සූත්‍ර කිහිපයක ම විශේෂයෙන් අවධාරණය කර තිබෙනු දක්නට ලැබේ *(...යදිදං නාමරූපං සහ විඤ්ඤාණේන අඤ්ඤමඤ්ඤපච්චයතාය පවත්තති'* මහානිදාන සූත්‍රය, දී.නි.2, 94 පිට). නලකලාප සූත්‍රයෙහි දැක්වෙන පරිදි එකිනෙකට හේත්තු කොට සිටුවා ඇති බට මිටි දෙකක් එකිනෙක ආධාරයෙන් පවතින්නාක් මෙන් නාමරූප - විඤ්ඤාණ දෙක එකිනෙකට උපකාරවත් ව පවතී. මෙලෙස නාමරූප හා විඤ්ඤාණ යන අංග දෙක විශේෂයෙන් අවධාරණය කිරීමට ප්‍රධාන හේතුව වන්නේ එක් භවයකින් තවත් භවයකට ප්‍රතිසන්ධි ගැනීමේ දී මේ අංග දෙක පැහැදිලි කාර්යභාරයක් සිදු කරන හෙයිනි.

පටිච්චසමුප්පාදයට අනුව (ප්‍රතිසන්ධි) විඤ්ඤාණයට අනුව නාමරූප නිර්මාණය වන අතර යමකු මෙලොව උපත ලද පසු අතීත විපාක වශයෙන් පහළ වන ස්කන්ධ පංචකය පිළිබඳ අනවබෝධය ඇති විට නාමරූපයන්ට අනුව විඤ්ඤාණය නිර්මාණය වේ. එවිට නාමරූප පච්චායා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං වශයෙන් දෙපසට ක්‍රියාත්මක වෙමින් සංසාර චක්‍රය තුළ දිගින් දිගට ම සැරිසරයි.

මහානිදාන සූත්‍රයෙහි දැක්වෙන පරිදි 'විඤ්ඤාණය මව්කුසෙහි බැස නොගන්නේ නම් නාමරූපයන්ගේ පහළවීමක් නොවේ' (...*විඤ්ඤාණං ච හි ආනන්ද මාතුකුච්ඡිස්මිං න ඔක්කමිස්සථ, අපි නු බෝ නාමරූපං මාතුකුච්ඡිස්මිං සමුච්චිස්සථාති'? 'නො හෙතං භන්තේ'*). විඤ්ඤාණය මව්කුසකට බැස ගත්ත ද එම විඤ්ඤාණය නැවත මව්කුසින් ඉවත් වන්නේ නම් නාමරූපයන්ගේ වැඩිදියුණුවක් ද සිදු නොවේ ('*විඤ්ඤාණං ච හි ආනන්ද මාතුකුච්ඡිං ඔක්කමිත්වා වොක්කමිස්සථ, අපි නු බො නාමරූපං ඉත්ථත්තාය අභිනිබ්බත්තිස්සථාති' 'නො හෙතං භන්තේ'*). තවද විඤ්ඤාණය සිඳී ගියහොත් නාමරූපයන්ගේ වර්ධනයක් හෝ කිසියම් නමක් ඇති පුද්ගලයකුගේ නිර්මාණය සිදු නොවනු ඇත (මහානිදාන සුත්ත, දී.නි.2, 92 පිට). සළායතන, ඵස්ස ආදි සෙසු අංගයන්හි ක්‍රියාකාරීත්වය සිදු වන්නේ නාමරූප විඤ්ඤාණ දෙකෙහි ස්ථාවර ක්‍රියාකාරීත්වය මතයි. මෙයින් පැහැදිලි වන්නේ නාමරූප මව්කුසෙහි බැස ගැනීමටත් එය වර්ධනය වීමටත් විඤ්ඤාණය ඍජු දයකත්වයක් දක්වන බවයි.

### පටිඝ සම්ඵස්සය හා අධිවචන සම්ඵස්සය

දීඝනිකාය මහානිදාන සූත්‍රයෙහි පටිච්චසමුප්පාදය විස්තර කිරීමේ දී විශේෂ කරුණක් සාකච්ඡාවට භාජනය කොට තිබේ. එනම් පටිඝසම්ඵස්සය හා අධිවචන සම්ඵස්සයයි. පටිඝ සම්ඵස්සය යනු ඇස, කන, නාසය, දිව, කය යන ආයතන පහට රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ යන අරමුණු ස්පර්ශ වීමයි. මෙය රළු ස්පර්ශය වශයෙන් සඳහන් වේ. අධිවචන සම්ඵස්සය යනු මනින්ද්‍රියට ධර්මාලම්භන අරමුණු වීමයි. මෙය සුඛුම (සියුම්) ස්පර්ශය වශයෙන් දැක්වේ. සාමාන්‍යයෙන් යමෙකු ජීවත්වීම යනු ඇස, කන, නාසය, දිව, කය, මනස යන ඉන්ද්‍රිය හයට රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම යන අරමුණු ස්පර්ශ වීම් වශයෙන් අද්දැකීම් ලැබීමයි. මෙම ආයතන හය හා ඊට ගෝචර වන බාහිර අරමුණු හැර ජීවිතයෙහි වෙනත් කිසිවක් නොමැත. පුද්ගලයාගේ සමස්ත ජීවිතය මෙම ආයතන මත රඳා පවතී.

මහානිදාන සූත්‍රයේ 'නාමරූපපච්චයා ඵස්සෝ' යන විග්‍රහයෙහි දී දැක්වෙන විශේෂ කරුණක් වන්නේ පටිඝ සම්ඵස්සය අධිවචන සම්ඵස්සයටත් අධිවචන සම්ඵස්සය පටිඝ සම්ඵස්සයටත් බලපාන ආකාරයයි.

### රූපකායෙ අධිවචනසම්ඵස්සයඃ

*'යෙහි ආනන්ද ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තේහි යෙහි උද්දේසෙහි නාමකායස්ස පඤ්ඤත්ති හොති, තෙසු ආකාරෙසු තෙසු ලිඞ්ගෙසු තෙසු නිමිත්තෙසු තෙසු උද්දෙසු අසති අපි නු බෝ රූපකායෙ අධිවචනසම්ඵස්සො පඤ්ඤයෙථාති? 'නො හෙතං භන්තෙ'*

'ආනන්ද, යම් ආකාරයන්ගෙන් යම් ලිඞ්ගයන්ගෙන් යම් නිමිතිවලින් යම් උද්දේසයන්ගෙන් නාමකයට ප්‍රඥප්ති වේද, ඒ ආකාර ලිඞ්ග නිමිති උද්දේස නැති කල්හි රූපකයෙහි අධිවචන සම්ඵස්සය පැනවීමක් වන්නේ ද? ස්වාමීනි, එසේ නොවන්නේ ය'.

මෙයින් ප්‍රකට කෙරෙන්නේ ආයතන කුසලතාව ඇති කර ගත යුතු ආකාරයයි. අවිද්‍යා සහගතව අපි ඇස, කන ආදි කිසියම් ආයතනයකින් රූප, ශබ්දදි අරමුණක් ගත් විට එය සෙසු ඉන්ද්‍රියයන්ට සම්බන්ධ කර බලන්නෙමු. නිදසුනක් ලෙස මලක් දුටු විට එය තමාගේ මනසේ අතීත අද්දැකීම් සමඟ මුසු කොට නව සංස්කාරයක් ගොඩනගා ගනී. අවිද්‍යා සහගත මනසේ ස්වභාවය මෙයයි. එවිට ඉන්ද්‍රිය මගින් ගන්නා අරමුණු විෂයයෙහි ඇලීම්, ගැටීම් හෝ උපේක්ෂා හටගනී. මේ කුමක් ස්පර්ශ කළ ද අපි දුකින් නොමිදුනාහු වෙමු. ආයතන කුසලතාව යනු දුක හටගන්නා මෙම ආකාරය මැනැවින් නුවණින් දැක ඇස, කන ආදි ඉන්ද්‍රිය මගින් රූප, ශබ්ද ආදි අරමුණ ගන්නා විට එය වෙනත් ආයතනයකට ගැට නොගසා ඒ ආයතනය තුළදී ම නිරුද්ධ වන දර්ශනයකින් හා සිහියකින් යුතුව සිටීමයි. මෙහි දී විශේෂයෙන් රූපකායේ අධිවචන සම්ඵස්සය පැනවීම වශයෙන් දක්වා ඇත්තේ ඇස, කන, නාසය, දිව, කය යන ඉන්ද්‍රිය පහට පටිඝසම්ඵස්ස වශයෙන් අරමුණු ගෝචරවීමේ දී එය මනින්ද්‍රියට ගැටගැසීම් ස්වභාවයයි. යමෙක් මෙය නුවණින් දුටුව හොත් ඔහු ඇස, කන ආදි පංච ඉන්ද්‍රියයන්ගෙන් ගන්නා අරමුණු ඔස්සේ මනසට බැස ගැනීම නොකරයි. එවිට ඔහුගේ අවිද්‍යා සහගත ස්පර්ශය දුරුවූයේ වෙයි. දුක නිර්මාණය වන පටිච්චසමුප්පාද න්‍යායයෙන් ඉවත් වූයේ වෙයි.

**නාමකායේ පටිඝසම්ඵස්සයඃ**

*'යෙහි ආනන්ද ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තේහි යෙහි උද්දේසෙහි රූපකායස්ස පඤ්ඤත්ති හොති, තෙසු ආකාරෙසු තෙසු ලිඞ්ගෙසු තෙසු නිමිත්තෙසු තෙසු උද්දෙසු අසති අපි නු ඛෝ නාමකායෙ පටිඝසම්ඵස්සො පඤ්ඤයෙථාති? 'නො හෙතං භන්තෙ'*

'ආනන්ද, යම් ආකාරයන්ගෙන් යම් ලිඞ්ගයන්ගෙන් යම් නිමිතිවලින් යම් උද්දේසයන්ගෙන් රූපකයට ප්‍රඥප්ති වේද, ඒ ආකාර ලිඞ්ග නිමිති උද්දේස රූප කයට නැති කල්හි නාමකයෙහි පටිඝසම්ඵස්සය පැනවීමක් වන්නේ ද?' යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්න කළ විට ආනන්ද මාහිමියන් පිළිතුරු දෙන්නේ 'ස්වාමීනි, එසේ නොවන්නේ ය'. යනුවෙනි.

මෙයින් පැහැදිලි කෙරෙන්නේ රූපයන් පිළිබඳව ලිඞ්ග, නිමිති, උද්දේස ආදි වශයෙන් ප්‍රඥප්ති ඇති විට සිතට ධම්මාලම්බන අරමුණු වූ විට ඒ ඔස්සේ රූප, ශබ්දදි පංච විඤ්ඤාණයට ලක්වන අරමුණු විෂයයෙහි සිත බැස ගන්නා බවයි. එනම් අවිද්‍යා සහිගතව සිටින විට සිතට කිසියම් සිතිවිල්ලක් පැමිණීමේ දී එය බාහිර රූපයකට බැඳ ගන්නා බවයි. එවිට සිත බාහිර අරමුණුවල බැස ගනියි. නිදසුනක් වශයෙන් තම මව සිහි වූ විට මවගේ රූපය, ඇයගේ කටහඬ ආදිය පිළිබඳව සිත බැස ගැනීමයි. ලුණු සිහිවූ විට ලුණු කැටයක් මැවී පෙනෙන ස්වභාවයයි. මෙලෙස සිතට සිතිවිලි නැගෙන විට ඒ ඔස්සේ රූප නිර්මාණය කිරීම් වශයෙන් පටිඝසම්ඵස්සය කරා යාම අවිද්‍යා සහගත මනසේ ස්වභාවයයි. එවිට දුකින් නොමිඳුනේ ජරා, මරණාදි දුක් ස්පර්ශ කරමින් සිටී. එසේ නොවීමට නම් සිතට සිතිවිල්ලක් පැමිණි සැණින් ම එය සිත තුළ ම නිරුද්ධ වන දර්ශනයකින් යුතුව සිටීම අවශ්‍ය කෙරේ. 'විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං.... ' යනුවෙන් දක්වෙන්නේ මෙම ආයතන කුසලතාවයි. එවිට සිතට නැගෙන අරමුණු බාහිර රූපයට බැඳ, බැස ගන්නා ස්වභාවයෙන් මිදෙයි. විද්‍යා සහගතව මෙලෙස සිහියෙන් හා නුවණින් ක්‍රියා කිරීමෙන් පටිච්චසමුප්පාදය චක්‍රයෙන් මිදී දුකින් නිදහස්වීමට අවකාශ සැලසේ.

මේ සඳහා හැම මොහොතක ම පටිච්චසමුප්පාද චක්‍රය සකස්වන ආකාරය පිළිබඳ මනා අවබෝධයකින් හා සතිසම්පජඤ්ඤයෙන් ක්‍රියා කිරීම අවශ්‍ය කෙරේ. ක්‍රමයෙන් දුකින් නිදහස්වීමට අවකාශ ලැබෙන්නේ මෙහි අඛණ්ඩව යෙදීමේ ප්‍රතිඵල වශයෙනි. ඒ සඳහා අප සතු සියල්ල කැප කළ යුතුව ඇත. ලැබූ මේ උතුම් ක්ෂණ සම්පත්තිය අභිමිවීමට ප්‍රථම හැකිතාක් දුරටත් ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්ම දියුණු කළ යුතු ය. ඒ සඳහා තෙරුවන් සරණින් ඔබ සැමට සියලු කායික මානසික සුවපත් බව ලැබේවා.

# කායානුපස්සනාව

සතර සතිපට්ඨානයෙහි මුල් ම පියවර කයෙහි කය අනුව නුවණින් මෙනෙහි කිරීමයි. එනම් තමාගේ භෞතික කය සහ ඊට සම්බන්ධ අංශයන්හි ක්‍රියාකාරීත්වය පිරිසිඳ දැනීම ඉලක්ක කොට ගෙන ශරීරය පිළිබඳ ඇති ආත්ම දෘෂ්ටිය දුරුකරලනු සඳහා සිහිය වැඩීමයි. මෙහි දී සතර සතිපට්ඨානය සඳහා ම පොදුවේ දෙන උපදෙසක් නම් ***'ආතාපී'*** කෙලෙස් තවන වැර ඇතිව, ***'සම්පජානො'*** නුවණින් මෙනෙහි කොට ***'සතිමා'*** සිහියෙන් යුතුව ***'විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං'*** ලෝකය පිළිබඳව දැඩි ලෝභය හා දෙම්නස දුරුකොට මෙම භාවනාව ප්‍රගුණ කළ යුතු ය යන්නයි. ඒ අනුව සිත පිහිටවිය යුත්තේ රාග, ද්වේෂ, මෝහ යන කෙලෙස් දුරුකරලීම ඉලක්ක කොට නුවණින් මෙනෙහි කොට සිහියෙන් යුතුව ලොවට ඇති දැඩි ඇල්ම හා දෙම්නස් දුරුකරලමින් බව ආරම්භයෙහි දී ම අවධාරණය කොට තිබේ.

**1. ආනාපානසති** :- කායානුපස්සනාවෙහි මුල් පියවර හුස්ම ගැනීම හා පිටකිරීම පිළිබඳ වූ සිහිය නම් වූ ආනාපාන සතියයි. දක්ෂ ලී වඩුවෙකු ලී ඉරන විට තම කියත ඇදීමේ දී එහි ක්‍රියාකාරීත්වය ගැන සිහියෙන් සිටින්නාක් මෙන් තම ශරීරයෙහි නිරතුරුව සිදු වන හුස්ම ගැනීම හා හෙළීම පිළිබඳව සිහියෙන් සිටින ලෙස මෙමගින් උපදෙස් දේ. මෙහි දී ස්වාභාවිකව සිදුවන ස්වසනයට අදාළව සිහියෙන් හුස්ම ගනිමින් දීර්ඝව හුස්ම ගැනීමේ දී දීර්ඝව හුස්ම ගන්නා බවත් හ්‍රස්වව හුස්ම ගැනීමේ දී හ්‍රස්වව හුස්ම ගන්නා බවත් සියලු හුස්ම කය පිළිබඳවත් හුස්ම සංසිඳුවමිනුත් ගැනීමත් වශයෙන් හුස්ම ගැනීමේ දී හා හෙළීමේ දී කායිකව සිදුවන ක්‍රියාකාරීත්වය පිළිබඳ මනා සිහියෙන් ක්‍රියා කිරීම අවධාරණය කොට තිබේ.

මෙලෙස සිහිය ප්‍රගුණ කිරීමේ දී තමාගේ කය පිළිබඳව වැඩි අවධානයෙන් ක්‍රියා කරන අතර අන් අයකුගේ ශරීරයක් පිළිබඳව පෙනී යාමේ දී ඒ පිළිබඳව ද සිහිය යෙදීම දක්වා තිබේ. මෙහි අවසානයට සඳහන් කොට ඇත්තේ හුස්ම ගැනීම හා හෙළීම තුළින් ඇතිවන ශාරීරික ක්‍රියාකාරීත්වයේ හටගැනීමේ හා නිරුද්ධ වීමේ ස්වභාවය වූ අනිත්‍යතාව නුවණින් මෙනෙහි කරන ලෙසයි. මෙහි ප්‍රතිඵල වශයෙන් ඇත්තේ කයක් පමණක් ය යනුවෙන් සත්ත්ව සංඥව දුරුකොට දැකීමේ නුවණක් හටගනී. එමගින් ශරීරය පිළිබඳ කිසිවක් උපාදාන වශයෙන් නොගනී. කායානුපස්සනාව වැඩීමෙහි අරමුණ මෙමගින් පැහැදිලි වේ.

**2. ඉරියාපථ** :- යාම, සිටීම, හිඳීම, සැතපීම යන සිව් ඉරියව්ව ම පිළිබඳ මනා සිහියෙන් සිටිමින් සත්ත්ව සංඥව දුරුවන අයුරින් මෙනෙහි කරමින් ලොවෙහි කිසිවකට නොඇලී සිටීම ඉරියාපථ පියවරේ දී සිදු කෙරේ.

**3. සම්පජඤ්ඤය** :- නිතිපතා අවදි වූ මොහොතේ පටන් නින්දට යනතුරු සිදුවන කෑම්, බීම්, සැතපීම්, හැඳීම්, සිටීම් ආදි සියලු ශාරීරික ක්‍රියාකාරීත්වයන් පිළිබඳ මනා සිහියෙන් සිටිමින් ඒ කිසිවක් ආත්ම කර නොගනිමින් ඇත්තේ කයක් පමණි යන නුවණ ඇති කර ගැනීම සම්පජඤ්ඤ පබ්බයෙන් සිදු කෙරේ.

**4. පටික්කූල මනසිකාර** :- ශරීරය නිර්මාණය වී ඇති කෙස්, ලොම්, නිය, දත්, සම් ආදි දෙතිස් කුණපයන් පිළිබඳ සිහියෙන් සිටිමින් කය පිළිබඳ තවදුරටත් නුවණින් බලමින් ආත්ම සංඥව දුරුවන ලෙස සිහිය දියුණු කිරීම මෙහි දී සිදුවේ. කට ගැටගැසූ විවිධ ධාන්‍ය වර්ගවලින් සමන්විත මල්ලක් ලෙස මෙම ශරීරය බැලීමට මෙමගින් හුරු කෙරේ.

**5. ධාතු මනසිකාර** :- අපගේ භෞතික ශරීරය සැදි මූලික පදර්ථ හතර වන පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහාභූත රූපයනට සිත තබා නුවණින් බැලීම මෙහි දී සිදු කෙරේ. එමගින් ද සත්ත්ව සංඥව දුරුවන අයුරින් මෙනෙහි කෙරේ. ගවයකු ඝාතනය කොට සතර මං හන්දියක තබා ඇති විට හරකා යන සංඥව දුරුව ඇත්තාක් මෙන් මිනිස් ශරීරය සැදි මූලික පදර්ථ වන මෙම කොටස් හතරට හිත තබා බලන විට තම ශරීරය පිළිබඳව ඇති ආත්ම දෘෂ්ටිය ක්‍රමයෙන් පහව යයි.

**6. නවසීවථික** :- මිනිස් ශරීරය මරණයට පත් වූ විට එය ක්‍රමයෙන් ඇට සැකිල්ලක් දක්වා විකාශනය වන අවස්ථා පිළිබඳ නුවණින් මෙනෙහි කිරීම මෙමගින් සිදු කෙරේ. ඒ අනුව සිහිය දියුණු කිරීමේ දී ද ශරීරය පිළිබඳව ඇති දැඩි ඇල්ම, ආත්ම සංඥව දුරුවේ.

ඉහත දක්වූ ආකාරය හය අනුව කය පිළිබඳව මෙනෙහි කිරීමේ දී ඇත්තේ කයක් පමණක් බවත් නිත්‍ය වූ ආත්ම වශයෙන් ගතහැකි කිසිවක් මේ කය තුළ නැති බවත් අවබෝධ වේ. මෙය තම සිරුර පිළිබඳව මෙන් අන් ශරීර දෙසට ද අදාළ කොට බලයි. එම අවබෝධයත් සමඟ තම ආධ්‍යාත්මික ලෝකය පිළිබඳ කිසිවක් ආත්ම වශයෙන් උපධි වශයෙන් නොගනී (*අත්‍ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති. න ච කිඤ්චි ලොකෙ උපාදියති*).

කය පිළිබඳ මෙබඳු අවබෝධයක් ලබා තවදුරටත් තම ජීවිතය පිළිබඳ අවබෝධය ලබා ගනු වස් සතිපට්ඨානයෙහි යෙදෙන ශ්‍රාවකයා තම වේදනා පිළිබඳව ද සිහිය හා නුවණ පුහුණු කරයි.

## වේදනානුපස්සනාව

වේදනානුපස්සනාව යනු ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ඉන්ද්‍රිය ඔස්සේ තමාට දැනෙන සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ, සාමිස සුඛ, නිරාමිස සුඛ, සාමිස දුක්ඛ, නිරාමිස දුක්ඛ, සාමිස අදුක්ඛමසුඛ, නිරාමිස අදුක්ඛමසුඛ යන වේදනා පිළිබඳව මනාව සිහිය පවත්වා ගැනීමයි. එලෙස සිහියෙන් සිටින අතර මනා නුවණින් එහි හටගැනීම් නිරුද්ධවීම් පිළිබඳ අනිත්‍යතාව දැකීම ද මෙහි දී සිදු වේ. ඒ අනුව ඇත්තේ වේදනා පමණක් බවත් සත්ත්වයකු වශයෙන් ගත හැකි කිසිවක් නොමැති බවත් ප්‍රත්‍යක්ෂ වේ. තවද ස්පර්ශය ඇතිවිට වේදනාව හටගන්නා බවත් ස්පර්ශය නිරුද්ධ වන විට වේදනාව නිරුද්ධ වන බවත් මෙහි දී අවබෝධ වේ. ඒ සමග ම වේදනා ලෝකය පිළිබඳ කිසිවක් උපධි වශයෙන් තෘෂ්ණා, දෘෂ්ටි, මාන වශයෙන් නොගනී (අත්‍ථි වේදනාති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති. න ච කිඤ්චි ලොකෙ උපාදියති).

වේදනානුපස්සනාවෙහි ප්‍රතිඵල වශයෙන් සතර ආහාරයන් අතුරින් ඵස්සාහාරය ප්‍රකට වන අතර ස්කන්ධ පංචකය අතුරින් වේදනාස්කන්ධය ප්‍රත්‍යක්ෂ කර ගැනීමේ හැකියාව ඇතිවේ. තම වේදනා පිළිබඳව ද අන් අයගේ වේදනා පිළිබඳව ද මෙලෙස නුවණින් මෙනෙහි කරයි. මෙහි දී මුලින් තමාගේ වේදනා පිළිබඳවත් පසුව අන් අයගේ වේදනා පිළිබඳවත් සිහිය හා නුවණ පවත්වයි.

## චිත්තානුපස්සනාව

සරාග, වීතරාග, සදෙස, වීතදෙස, සමොහ, වීතමොහ, සංඛිත්ත, වික්ඛිත්ත, මහග්ගත, අමහග්ගත, සඋත්තර, අනුත්තර, සමාහිත, අසමාහිත, විමුත්ත, අවිමුත්ත වශයෙන් සිතෙහි පවත්නා ස්වභාවයන් පිළිබඳව සිහියෙන් සිටිමින් එහි හටගැනීම් හා නිරුද්ධවීම් සංඛ්‍යාත අනිත්‍යතාව නුවණින් දකිමින් ඒ කිසිවක් ආත්ම වශයෙන් නොගෙන සිටීම චිත්තානුපස්සනාවෙන් සිදු කෙරේ. මෙලෙස චිත්තානුපස්සනාව වැඩීමේ ප්‍රතිඵල වශයෙන් ඇත්තේ සිතක් පමණක් ය සත්ත්ව පුද්ගල වශයෙන් ගත හැකි ආත්මීය යමක් නැත ය යන නුවණ පහළ වීමෙන් කිසිවක් පිළිබඳව උපධි හට නොගනී. තම සිත පිළිබඳව සිහියෙන් හා නුවණින් දකින ශ්‍රැතවත් ශ්‍රාවකයා අන් අයගේ ක්‍රියාකාරීත්වයන් තුළින් ඒ අයගේ සිත් පිළිබඳව ද මෙබඳු නුවණක් ඇති කර ගනී. මෙම අවබෝධයත් සමග ලොවෙහි කිසිවකට නොඇලෙන සිතක් ඇති කර ගනී (*අත්‍ථි චිත්තන්ති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති. න ච කිඤ්චි ලොකෙ උපාදියති*).

චිත්තානුපස්සනාව වැඩීමේ ප්‍රතිඵල වශයෙන් සතර ආහාර අතුරින් විඤ්ඤාණාහාරය ප්‍රකට වන අතර ස්කන්ධ පංචකය අතුරින් විඥනස්කන්ධය පිරිසිඳ දැක ගැනීමේ හැකියාව උදවේ.

මහාසතිපට්ඨාන සූත්‍රයේ දැක්වෙන පරිදි ආනාපානසති, ඉරියාපථ, සම්පජඤ්ඤ, පටික්කුල, ධාතු, නවසීවථික වශයෙන් කය පිළිබඳව කායානුපස්සනාව වැඩීමෙන් කයෙහි පවත්නා නිසරු බව මෙන් ම අසුභ

බව ප්‍රත්‍යක්ෂ වේ. පවත්නේ හුදු කයක් පමණක් බවත් ඊට අයත් ආත්ම වශයෙන් ගත හැකි පරමාර්ථමය වූ සත්ත්වයෙක් පුද්ගලයෙක් නොමැති බවත් අවබෝධ වීමෙන් තම ආධ්‍යාත්මික කය පිළිබඳව මෙන් ම බාහිර කයෙහි ද පවත්නා සියලු ඇලීම් ක්‍රමයෙන් දුරුවීමට අවශ්‍ය ඥානය ලැබේ. කය පිළිබඳ මෙකී අවබෝධය සහිත ව තවදුරටත් සතිපට්ඨානයෙහි යෙදෙන ශ්‍රැතවත් ශ්‍රාවකයා වේදනා පිළිබඳව ද නුවණින් මෙනෙහි කරයි. සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ වශයෙන් අත්විඳින ත්‍රිවිධ දුක්ඛය සාමිස, නිරාමිස වශයෙන් සයාකාර ව තමා පිළිබඳව මෙන් ම බාහිර වේදනා පිළිබඳව ද ඇතිවීම් නැතිවීම් අනුව නුවණින් මෙනෙහි කිරීමෙන්, පවත්නේ වේදනා පමණක් බවත් පරමාර්ථ වශයෙන් එහි විඳින්නෙක් නොමැති බවත් නුවණින් අවබෝධ වේ. එවිට කිසිදු වේදනාවක් තෘෂ්ණා, දෘෂ්ටි, මාන වශයෙන් ග්‍රහණයට නොයයි. කය පිළිබඳව මෙන් ම වේදනා පිළිබඳ ව ද නුවණින් බලන ශ්‍රාවකයා ඉන් නොනැවතී තවදුරටත් සතිපට්ඨානයෙහි යෙදෙමින් සිතෙහි සිත අනුව නුවණින් බලමින් කල් ගෙවයි. මෙහි දී සිතට පහළ වන සරාග - වීතරාග, සදෝස - වීතදෙස, සමෝහ - වීතමෝහ, සංඛිත්ත - වික්ඛිත්ත, මහග්ගත - අමහග්ගත, සඋත්තර - අනුත්තර, සමාහිත - අසමාහිත, විමුත්ත - අවිමුත්ත වශයෙන් සිතෙහි හටගන්නා කුසලාකුසල සිතිවිලි ඇතිවීම් නැතිවීම් වශයෙන් චින්තනයෙහි යෙදෙමින් චිත්තානුපස්සනාව වඩයි. හේතුඵල දහමට අනුගත සිතක්, සිතීමක් පැවැතිය ද සිතන්නෙක් නැත යන අවබෝධය මෙමගින් ලැබීමත් සමග නොඇලීම දියුණු වෙයි. මෙලෙස කය පිළිබඳව සිහිය හා නුවණ වැඩීම අරඹා වේදනා, චිත්ත පිළිබඳ ව ද සිත භාවිත කරන නුවණැති ශ්‍රාවකයා තම භාවිත සිත වඩාත් සංකීර්ණ අංශයක් වූ ධම්මානුපස්සනාව වෙත යොමු කරයි. කායානුපස්සනාදි පළමු සතිපට්ඨාන තුනෙහි යළි යළිත් සිත භාවිත කොට තිබීම ධම්මානුපස්සනාව සඵල වීමට හේතු වන්නකි.

## ධම්මානුපස්සනා

ඉහත සඳහන් පරිදි කාය, වේදනා, චිත්ත පිළිබඳව සිහිය හා නුවණ දියුණු කිරීමෙන් අනතුරුව ඊ ළඟට පිවිසෙන්නේ සිතිවිලි හෙවත් සංඥා - චේතනා අවබෝධ කර ගැනීම ඉලක්ක කොට ගත් ධම්මානුපස්සනාව වෙතයි. මෙය වැඩීමෙන් සතර ආහාර අතුරින් මනෝසංචේතනාහාරය ප්‍රකට වේ.

'ධම්ම' (සං.ධම්ම) යනු බුදුදහමෙහි සඳහන් විවිධ අර්ථ සඳහා භාවිත සංකීර්ණ පදයකි. 'සබ්බෙ ධම්මා අනත්තා' යන්නෙන් ලෞකික හා ලෝකෝත්තර ධර්මතා දැක්වීම සඳහා ද 'වය ධම්මා සංඛාරා' යන්නෙන් සංඛත ධර්මයන් දැක්වීම සඳහා ද *'යො ඛො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො සො වො මමච්චයෙන සත්ථා'* යන්නෙන් බුදුරදුන් විසින් දේශිත සූත්‍ර ධර්ම දැක්වීම සඳහා ද *'ධම්මො'සධ සමං නත්ථි එතං පිවථ භික්ඛවො'* මෙන් ම *'ස්වාක්ඛාතො භගවතා ධම්මො'* යන්නෙන් සියලු බුද්ධවචනය දැක්වීම සඳහා ද *'ධම්මෙසු ධම්මානුපස්සී විහරති'* යන්නෙන් කුසලාකුසල ධර්ම දැක්වීම සඳහා ද *'...බුද්ධෙ වා ධම්මෙ වා සංඝෙ වා මග්ගෙ වා පටිපදය වා ....'* යන්නෙන් රත්නත්‍රය අතුරින් ධර්ම රත්නය දැක්වීම සඳහා ද 'ධම්ම' යන්න භාවිත කොට ඇත. මේ අතර මහාසතිපට්ඨාන සූත්‍රයෙහි දැක්වෙන 'ධර්මයන් පිළිබඳ ව ධම්මානුපස්සී ව වාසය කරන්න' යනුවෙන් කෙරෙන අනුශාසනාවට අනුව ධර්ම යන්නෙන් විශේෂයෙන් අදහස් කෙරෙන්නේ සාංසාරික පැවැත්මට හේතුවන නීවරණ, පංචුපාදනස්කන්ධ ආදි අකුසල ධර්ම හා සාංසාරික නිර්වෘතියට හේතුවන බොජ්ඣංග, ආර්ය සත්‍යය යනාදි කුසල දහම් පිළිබඳවයි. 'අනුපස්සනා' යනු යමක් අනුව සිතීමයි. ඒ අනුව 'ධම්මානුපස්සනා' යනු කුසලාකුසල ධර්ම අනුව යළි යළිත් නුවණින් මෙනෙහි කිරීමයි.

සතර සතිපට්ඨානයන් අතුරින් වඩාත් වැදගත් මෙන් ම සංකීර්ණ අංගය වන්නේ අවසානයට එන ධම්මානුපස්සනාවයි. සඤ්ඤා, චේතනා යන චෛතසික මෙන් ම සඤ්ඤා, සංඛාර යන ස්කන්ධද්වය ද මනෝසංචේතනාහාරය ද පිරිසිඳ දැනීමටත් අනාත්ම දෙයෙහි ආත්ම සංඥාව (අනත්තෙ අත්තසඤ්ඤා) නමැති විපල්ලාසය දුරුවීමටත් ධම්මානුපස්සනාව බෙහෙවින් උපකාරී වේ. ධම්මානුපස්සනාව වඩමින් අකුසල ප්‍රහීණ වන ආකාරයත් කුසලය වැඩෙන ආකාරයත් සාංදෘෂ්ටික වශයෙන් නුවණින් දකිමින් නිවන් මගෙහි හික්මෙන්නා ක්‍රමයෙන් දුකින් මිදෙමින් පරම සැපත වෙත පියනගයි.

ධම්මානුපස්සනාව යටතේ නීවරණ, ඛන්ධ, ආයතන, බොජ්ඣංග, ආර්ය සත්‍ය යන අකුසල හා කුසල යන දෙඅංශය පිළිබඳව ම යළි යළිත් නුවණින් විමසා බැලේ. මෙහි දී විශේෂයෙන් ආර්ය සත්‍යය පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡා කෙරේ.

**1. නීවරණ :-**

නීවරණ යනු නිවන ආවරණය කෙරෙන අකුසල පාර්ශ්වය නියෝජනය කෙරෙන කෙලෙස් හෙවත් සංයෝජනයන් ය. එනම් කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන පහයි. නුවණැති ශ්‍රැතවත් ශ්‍රාවකයා තමා තුළ දැනට පවත්නා කාමච්ඡන්දයේ ඇති බව ද නැති කාමච්ඡන්දයේ නැති බව ද නුපන් කාමච්ඡන්දයේ ඉපදීම ද උපන් කාමච්ඡන්දයේ ප්‍රහාණය ද ප්‍රහීණ වූ කාමච්ඡන්දයේ යළි නූපදීම ද නුවණින් දකියි.

ව්‍යාපාද ආදි සෙසු නීවරණ පිළිබඳව ද මෙලෙසින් ම යළි යළිත් නුවණින් බලයි. තමා පිළිබඳව මෙන් ම මෙරමා පිළිබඳ ව ද මෙලෙස බැලීමෙන් සමුදය (හටගැනීම්), අත්ථංගම (නිරුද්ධවීම්) ද නුවණින් දකිමින් අනිත්‍ය ස්වභාවය ද පසක් කරයි. නීවරණ පිළිබඳව මෙලෙස නුවණින් බැලීමේ ප්‍රතිඵල වශයෙන් ලොව කිසිවක් තෘෂ්ණා, දෘෂ්ටි, මාන වශයෙන් නොගෙන නොඇලී, ගැටීම්වලින් තොර ව විසිය හැකි ලෙස සිය මනස සකසා ගනී.

මෙහිලා තම සිහිය හෙවත් අවධානය නිරතුරු ව පවත්වා ගැනීම වැදගත් වේ. භෞතික වශයෙන් තමා සමීපයෙහි ඇති දෙයක් ඇතැයි ද එය නැති වූ විට නැතැයි ද පළමු ව නොතිබුණු දෙයක් තමා වෙත පැමිණීමේ දී එසේ පැමිණීම ද පැමිණි දෙයක (නැවත නොපැමිණෙන ලෙස) ඉවත් ව යාම ද එලෙස ඉවත් ව ගිය දෙයක් යළි කිසිදු නොපැමිණෙන්නේ යැයි ද යම් අවබෝධයක් වෙයි ද එමෙන් ම මානසික ස්වභාවයක් වූ කාමච්ඡන්දය පිළිබඳ ව ද මනා සතිමත් බවකින් සිටීම මෙහි දී අවධාරණය කෙරේ. මෙලෙස සිහියෙන් සිටීමෙන් කාමච්ඡන්දය දිගු කලක් සිතෙහි නොරඳින අතර එය වහා දුරු කර ගැනීමට අවකාශ සැලසේ. ආරම්භයේ දී පැමිණි කාමච්ඡන්දය දුරු කරන අතර කල් යාමේ දී නිරතුරුව සතිපට්ඨානය භාවිත කිරීමේ ප්‍රතිඵල වශයෙන් සිතට එබඳු අදහසක් පැමිණෙත් ම වහාම ඉන් සිත මුදවා ගැනීමට හැකියාව ලැබේ. ඉන්ද්‍රිය භාවනා සූත්‍රයෙහි භාවිතින්ද්‍රිය පුද්ගලයාගේ ලක්ෂණ දක්වන අවස්ථාවෙහි මේ පිළිබඳව කරුණු සඳහන් වේ. ඒ අනුව චක්ඛු ඉන්ද්‍රිය ඇසුරින් රූප අරමුණු කොට නීවරණයක් ජනිත වීමේ දී ඇසි පිය ගසන තරම් ක්ෂණයක දී ද සෝත ඉන්ද්‍රිය ඇසුරින් ශබ්ද අරමුණු කොට නීවරණයක් ජනිත වීමේ දී බලවත් පුරුෂයෙක් අසුරු ගසන තරම් වේලාවක දී ද ඝාන ඉන්ද්‍රිය ඇසුරින් ගන්ධය අරමුණු කොට නීවරණයක් ජනිත වීමේ දී මඳක් නැඹුරු කළ පියුම්පතෙහි දිය බිඳක් පෙරළෙන තරම් ක්ෂණයක දී ද ජිව්හා ඉන්ද්‍රිය ඇසුරින් රස අරමුණු කොට යම් නීවරණයක් හට ගැනීමේ දී දිවගට පත් කෙළ පිඩක් වහා ඉවත් කරන තරම් වේලාවක දී ද කාය ඉන්ද්‍රිය ඇසුරින් ඵොට්ඨබ්බය අරමුණු කොට යම් නීවරණයක් ජනිත වීමේ දී බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන නොහොත් දිගු කළ අතක් හකුළන තරම් ක්ෂණයක දී ද මන ඉන්ද්‍රිය ඇසුරින් ධර්ම අරමුණු කොට යම් නීවරණයක් ඇති වීමේ දී අධික ලෙස රත් වූ යකඩ බඳුනකට දියබිඳක් දැමූ විට එය සිඳී යන තරම් ක්ෂණයක දී ද වශයෙන් ඉතා ස්වල්ප කාලයක දී සිතට නැගෙන නීවරණ දුරු ව සිත උපේක්ෂාවෙහි පිහිටන බව සඳහන් වේ.

ධම්මානුපස්සනාවට අනුව නීවරණ පිළිබඳ ව සතිමත් බවෙහි යෙදීමේ ප්‍රතිඵල වශයෙන් නීවරණ හේතුවෙන් සිතට නැගෙන පීඩාව, පරිදහය දුරු කර ගැනිමට අවස්ථාව උදවේ. කෙලෙස් දුරු කිරීමෙන් සිතෙහි ප්‍රසන්න බව ඇති වීමෙන් හටගන්නා ප්‍රීතිය නිසා තව තවත් ධර්මයෙහි යෙදීමේ නියැලෙයි.

**2. ස්කන්ධ :-**

බුදුදහමෙහි සත්ත්ව සංයුත්තිය පිළිබඳ ප්‍රධාන ඉගැන්වීම 'ස්කන්ධ' (පා.ඛන්ධ) විග්‍රහය මගින් ඉදිරිපත් කෙරේ. 'ස්කන්ධ' යනු 'ගොඩ', 'සමූහය', 'රාශිය' යන පදවලින් සිංහලයෙහි දැක්වෙන ඒකරාශී වූ දෙය යන අදහස ගෙනදේ. සිත, කය සහිත සත්ත්වයකුගේ සමස්ත සංයුතිය ස්කන්ධ හෙවත් සමූහ පහක් යටතේ මෙහි දක්වා තිබේ. එනම් රූපස්කන්ධ, වේදනාස්කන්ධ, සංඥාස්කන්ධ, සංස්කාරස්කන්ධ, විඥානස්කන්ධ යනුයි. දුක

පිළිබඳ විග්‍රහයක යෙදෙන බුදුරජාණන් වහන්සේ බොහෝ අවස්ථාවන්හි දී උපාදනස්කන්ධ පංචකය පිළිබඳව කරුණු දේශනා කොට ඇත. ඒ අතර මජ්ඣිම නිකායේ හද්දෙකරත්ත හා මහාපුණ්ණම සූත්‍ර, සංයුත්ත නිකායේ ඛන්ධ සූත්‍ර, සංයුත්ත නිකායේ සමස්ත ඛන්ධ වග්ගය ප්‍රධාන වේ. තවද පටිසම්භිදමග්ගයෙහි චරියානානත්තඤාණ විස්තරයෙහි විඤ්ඤාණචරියා, අඤ්ඤාණචරියා හා ඤාණචරියා යන විස්තරයෙහි ද මීට අදළ වැදගත් තොරතුරු විස්තර වේ.

කායානුපස්සනා ආදි සතිපට්ඨාන සතර වැඩීමේ දී රූපාදි ස්කන්ධ පිළිබඳ ව අනිත්‍ය දුක්ඛ, අනාත්ම, නිබ්බින්ද, විරජ්ජ, නිරෝධ, පටිනිස්සග්ග වශයෙන් අනුපස්සනා කළ යුතු බව දක්වේ. එහි ප්‍රතිඵල වශයෙන් නිත්‍ය, සුඛ ආදි මිථ්‍යා විපල්ලාස දුරුවන අයුරු ද සඳහන් ව ඇත. 'සංඛිත්තෙන පඤ්චුපාදනක්ඛන්ධා දුක්ඛා' යන දූක පිළිබඳ විග්‍රහයට අනුව සත්ත්වයා අත්විඳින සියලු දුක් සමූහය සංක්ෂිප්ත වශයෙන් උපාදනස්කන්ධ පඤ්චකය තුළට ගොනු කළ හැකි ය. සංයුත්ත නිකායේ ඛන්ධ සූත්‍රයට අනුව 'දුක්ඛ ආර්ය සත්‍යය' යනුවෙන් එකලාව ම දක්වා ඇත්තේ 'පංචුපාදනස්කන්ධය' වශයෙනි (කථමඤ්ච භික්ඛවෙ, දුක්ඛං අරියසච්චං: පංචුපාදනස්ඛන්ධාතිස්ස වචනීයං.). රූපාදි ස්කන්ධ මම, මගේ, මගේ ආත්මය ලෙස සිතා තෘෂ්ණා, දෘෂ්ටි, මාන වශයෙන් ග්‍රහණය කර ගැනීම හේතුවෙන් සත්ත්වයා අපමණ දුකකට පත් ව අනන්ත සසරෙහි දිගු ගමනක යෙදෙමින් සිටියි.

ස්කන්ධ පංචකය අතුරින් **'රූප' යනු** පඨවි, ආපෝ, තේජො, වායෝ හා උපාදය රූප 24 { (ප්‍රසාද රූප 5 (චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය), ගෝචර රූප 4 (රූප, ශබ්ද, ගන්ධ, රස), භාවරූප 2 (ස්ත්‍රීභාව, පුරුෂභාව), හදයවත්ථු රූප, ජීවිත රූපය, කබලිංකාර ආහාර, ආකාශ ධාතු, විඤ්ඤත්ති රූප 2 (කාය විඤ්ඤත්ති, වචී විඤ්ඤත්ති), විකාර රූප 3 (ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා), ලක්ෂණ රූප 4 (උපචය, සන්තති, ජරතා, අනිච්චතා) } යන අටවිසි රූපයි. **'වේදනා' යනු** චක්ඛුසම්ඵස්සජාවේදනා, සොතසම්ඵස්සජාවේදනා, ඝානසම්ඵස්සජාවේදනා, ජිව්හාසම්ඵස්සජාවේදනා, කායසම්ඵස්සජාවේදනා, මනොසම්ඵස්සජාවේදනා යන වේදනා හයයි. **'සඤ්ඤා' යනු** රූපසඤ්ඤා, සද්දසඤ්ඤා, ගන්ධසඤ්ඤා, රසසඤ්ඤා, ඵොට්ඨබ්බසඤ්ඤා, ධම්මසඤ්ඤා යන හයයි. 'සංඛාර' යනු රූපසඤ්චේතනා, සද්දසඤ්චේතනා, ගන්ධසඤ්චේතනා, රසසඤ්චෙතනා, ඵොට්ඨබ්බසඤ්චේතනා, ධම්මසඤ්චේතනා යන හයයි. **'විඤ්ඤාණ' යනු** චක්ඛුවිඤ්ඤාණ, සොතවිඤ්ඤාණ, ඝානවිඤ්ඤාණ, ජිව්හාවිඤ්ඤාණ, කායවිඤ්ඤාණ, මනෝවිඤ්ඤාණ යන හයයි. ස්කන්ධ පංචකය හා එහි අනුකොටස් පරමාර්ථ වශයෙන් මෙලෙස බෙදා දැක්වුව ද පියෙවි ඇසට පෙනෙන්නේ මේ සියල්ල ඒකරාශී වූ සිත හා කය සහිත සත්ත්වයෙකි. නැතහොත් සිතින් තොර වූ අජීවී රූපයකි. පුද්ගලයා හෝ සත්ත්වයා යනුවෙන් අප ව්‍යවහාර කරන තැනැත්තා මෙකී ස්කන්ධ පංචකයක එකතුවකි. ස්කන්ධ පංචකය තනි පුද්ගලයෙක් ලෙස සලකා බැලීමේ දී ඝණසංඥාව නිසා ඇතිවන කෙලෙස් දුරුවීමට නම් ඒවා විශ්ලේෂණය කොට 'මේ රූපය ය, මේ රූපයේ හටගැනීම ය, මේ රූපයේ අස්තංගමය ය' යනුවෙන් නුවණින් ප්‍රත්‍යවේක්ෂණය කළ යුතු ය. වේදනාදි සෙසු ස්කන්ධ පිළිබඳ ව ද මෙලෙස පරාමර්ශනය කළ යුතු ය. එහි ප්‍රතිඵල වශයෙන් සත්ත්වයා ලෙස අප ව්‍යවහාර කරන මේ සිත සහිත රූපය තුළ සත්ත්ව වශයෙන් පවත්නේ ස්කන්ධ පංචකය යන ධර්මයන් පමණක් ය යන නුවණ පහළ වීමෙන් එහි කෙලෙස් දුරුවේ.

සත්ත්ව සන්තානගත සංයෝජන අතර සක්කාය දිට්ඨිය දුරු කිරීමට අපහසු සංයෝජනයකි. රූපාදී ස්කන්ධ පංචකය සහිත තම ජීවිතයෙහි තමා කැමැති ලෙස පාලනය කළ හැකි ස්වභාවයක් ඇතැයි යන හැඟීම සක්කාය දිට්ඨිය යන්නෙන් අදහස් වේ. කායාදි අනුපස්සනා සතරින් අපේක්ෂා කරන්නේ මෙම හැඟීම සන්තානයෙන් ඉවත් කිරීමයි. විශේෂයෙන් ධම්මානුපස්සනාව මේ සඳහා බෙහෙවින් වැදගත් වේ. රූප, වේදනාදි ස්කන්ධ පංචකය ස්ථාවර ව පවතී ය එය තම වසගයෙහි පවත්නා ගත හැක යන වැරදි දෘෂ්ටිය මත සක්කාය දිට්ඨිය රඳා පවතී. එනම් රූපය ආත්ම වශයෙන් ද ආත්මය රූපවත් යැයි ද ආත්මයෙහි රූපය ඇතැයි ද රූපයෙහි ආත්මය ඇතැයි ද වරදවා තේරුම් ගෙන සිටීමයි. වේදනාදි සෙසු ස්කන්ධ පිළිබඳව ද මෙලෙසින් ම සිතා සිටීම සක්කාය දිට්ඨියේ ලක්ෂණයයි. සතිපට්ඨානයෙහි ප්‍රතිඵල වශයෙන් මෙම මිථ්‍යා සංකල්පය ක්‍රමයෙන් ක්ෂය වී යයි.

### 3. ආයතන :-

ධම්මානුපස්සනාවෙහි තවදුරටත් නියැළෙන ශ්‍රැතවත් ශ්‍රාවකයා චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මන යන ආධ්‍යාත්මික ආයතන හය පිළිබඳ ව ද නුවණින් සම්මර්ශනයෙහි යෙදෙයි. සත්ත්වයා පිළිබඳ තවත් විග්‍රහයක් මෙහි දී ඉදිරිපත් කෙරේ. ඒ අනුව ඇස ද රූපය ද ඒ දෙක නිසා හටගන්නා සංයෝජන ද නූපන් සංයෝජනයාගේ ඉපදීම ද උපන් සංයෝජනයාගේ ප්‍රහාණය ද ප්‍රහීණ වූ සංයෝජනයාගේ නැවත නූපදීම ද නුවණින් බලයි. සෝත, ඝාන ආදි සෙසු ආයතන පිළිබඳව මෙලෙස බලයි. ආධ්‍යාත්මික ආයතන පිළිබඳව මෙන් ම බාහිර ආයතන පිළිබඳව ද හටගැනීම් නිරුද්ධවීම් වශයෙන් නුවණින් සලකා බැලීමේ දී සත්ත්ව සංඥාවෙන් තොරව ආයතන නමැති පරමාර්ථ ධර්මයන්හි පැවැත්ම වැටහීමත් සමග කිසිවක් සමග තෘෂ්ණා, දෘෂ්ටි, මාන වශයෙන් මිශ්‍ර නොවී සිටියි.

### 4. බොජ්ඣංග :-

නිර්වාණාවබෝධයට අංග (බෝධි අංග) වූ සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන බොජ්ඣංග ධර්ම සම්මර්ශනය කිරීම මෙහිදි සිදු කෙරේ. ඒ අනුව තමා තුළ ඇති සතිසම්බොජ්ඣංගය ඇතැයි ද තමන් තුළ නැති සතිසම්බොජ්ඣංගය නැතැයි ද නූපන් සතිසම්බොජ්ඣංගයාගේ ඉපදීම ද උපන් සතිසම්බොජ්ඣයාගේ වැඩීම හා පරිපූර්ණත්වය ද යළි යළිත් සිහිකරමින් වෙසෙයි. සිහිය හා නුවණ වැඩෙනු පිණිස ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන සෙසු අංග පිළිබඳව ද මෙලෙසින් සම්මර්ශනයෙහි යෙදෙයි.

සබ්බාසව සූත්‍රයට  අනුව භාවනා නමින් දක්වා ඇත්තේ බොජ්ඣංග ධර්ම වැඩීමයි. භාවනා නමින් වැඩිය යුතු අංග වශයෙන් බුදුදහමෙහි දක්වා ඇති කරුණු අතර සත්ත බොජ්ඣංගවලට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. විරාග නිශ්‍රිත ව නිරෝධ නිශ්‍රිත ව නිවනට යොමු වූවක් කොට වඩන බොජ්ඣංග ධර්මයන් නිසා කාමරාග, පටිඝ යන සංයෝජන ආදි කොට ඇති අවිද්‍යාව අන්ත කොට ඇති සංයෝජන ධර්ම ක්‍රමයෙන් ප්‍රහීණ වේ. මෙලෙස නිර්වාණාවබෝධයට බෙහෙවින් උපකාරී වූ සත්ත බොජ්ඣංග ධර්ම තමා තුළ වැඩෙන අයුරු නුවණින් සම්මර්ශනය කිරීම ධම්මානුපස්සනාවේ මෙම අංගයේ පරමාර්ථය වේ.

### 5. ආර්ය සත්‍යය :-

දුක්ඛ, සමුදය, නිරෝධ, මග්ග යන චතුරාර්ය සත්‍යය පිළිබඳ ව සවිස්තරාත්මක ව තත් වූ පරිදි නුවණින් සලකා බැලීම මෙහිදී සිදු වේ. දුක පිළිබඳ පරිපූර්ණ වැටහීමක් ලැබෙන මෙම අවස්ථාව ජීවිතයේ යථා තත්ත්වය අවබෝධ කර ගැනීමටත් හේතුඵල සම්බන්ධය වටහා ගැනීමටත් දුකින් නිදහස් වීමේ මාවත වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය මැනැවින් පසක් කර ගැනීමටත් මග පෙන්වයි.

දුක්ඛ සත්‍යය යටතේ ප්‍රථමයෙන් ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, අප්‍රිය සම්ප්‍රයෝග, ප්‍රිය විප්‍රයෝග, කැමැති දෑ නොලැබීම  යනුවෙන් දක්වෙන දුකෙහි ප්‍රභේද සාකච්ඡා කෙරේ. මෙහිදී අවධාරණය කෙරෙන විශේෂ කරුණක් නම් සත්ත්වයාට දුක හටගන්නේ හුදෙක් ජාති, ජරා, ව්‍යාධි, මරණාදි කරුණු ඉපදීම නිසා නොව ජාති, ජරා, ව්‍යාධි, මරණාදියට පත්වන ලෝකයෙහි එබඳු තත්ත්වයකට පත් නොවී සිටීමට ඇති බලවත් කැමැත්ත හා ප්‍රාර්ථනය තමා කැමැති පරිදි ඉටු නොවීම නිසයි. මෙකී වැරදි සංකල්පනාව යමකු වෙතින් දුරු වුවහොත් ඔහුට ජරා, ව්‍යාධි, මරණාදි දුක් එළඹිය ද කායික ව යම් අපහසුතාවක් දැනුණ ද මානසික ව ඔහුට එම දුක ඇති නොවේ. එම දුක තමාගේ දුකක් ලෙස නොසලකයි. බුදුදහමින් අනුශාසනා කරන්නේ වැරදි දෘෂ්ටිය දුරු කරලීමට අවශ්‍ය සම්මා දිට්ඨිය ලබාදීමටයි. දුක පිළිබඳ විග්‍රහය බුදුදහමේ ප්‍රධාන ඉගැන්වීමක් වන අතර එය ශ්‍රද්ධාව වර්ධනය වීමට ද හේතු (*දුක්ඛූපනිසා සද්ධා*) වන්නකි. ධම්මානුපස්සනාවෙහි ආර්යසත්‍යය විග්‍රහයෙහි දුක්ඛ සත්‍යය පිළිබඳව මෙනෙහි කිරීමේ දී ජාති, ජරා ආදි දුක්ඛයන් තමා වෙත පැමිණෙන බවත් ජාති, ජරා ආදිය තමා වෙත නොයේවා යැයි ප්‍රාර්ථනා කළ ද එය ඉටු නොවීම නිසා දුක හටගන්නා බව නුවණින් දකියි.

දුක්ඛ සත්‍යය නුවණින් සලකා බලා ඉන්පසු දුක්ඛ සමුදය හෙවත් දුකට හේතුව නුවණින් සලකා බලයි. මෙහිදී දුකට හේතුව (දුක්ඛ සමුදය) වන පුනර්භවය ඇති කෙරෙන නන්දිරාගයෙන් යුතු (කාම, භව, විභව යන) ත්‍රිවිධ තෘෂ්ණාව ජනිත වන ස්ථාන 10ක් යටතේ කරුණු විස්තර කොට ඇත.

එනම් :-

**1. චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මන යන අභ්‍යන්තර ආයතන හය**

ලොව යම් ප්‍රිය ස්වභාවයක් සැප (මධුර) ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටන්නේ ඇස, කණ ආදි ඉන්ද්‍රියයන්හි ඇල්ම හෙවත් තෘෂ්ණාව බව නුවණින් දකියි. සෝතාදි සෙසු ඉන්ද්‍රිය පිළිබඳ ව ද මෙලෙස සම්මර්ශනයෙහි යෙදෙයි.

**2. රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම යන බාහිර රූප හය**

ලොව යම් ප්‍රිය ස්වභාවයක් සැප (මධුර) ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටන්නේ රූපාදි බාහිර ඉන්ද්‍රියයන්හි ආශාව නිසා බව නුවණින් දකියි. ශබ්ද ආදි සෙසු අරමුණු පිළිබඳ ව ද මෙලෙසින් නුවණින් මෙනෙහි කරයි.

**3. චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ, මනෝ විඤ්ඤාණ යන ඇස් ආදි ඉන්ද්‍රිය විෂයයෙහි පහළවන සිත් හය**

ලොව යම් ප්‍රිය ස්වභාවයක් මධුර ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටන්නේ චක්ඛු ආදි විඤ්ඤාණ හය විෂයයෙහි ඇල්ම නිසා බව නුවණින් මෙනෙහි කරයි.

**4. චක්ඛු සම්ඵස්ස, සෝත සම්ඵස්ස, ඝාන සම්ඵස්ස, ජිව්හා සම්ඵස්ස, කාය සම්ඵස්ස, මනෝ සම්ඵස්ස යන ස්පර්ශ හය**

ඇස, රූපය හා විඤ්ඤාණය යන කරුණු තුනෙහි එකතුවෙන් චක්ඛු සම්ඵස්සය උපදී. සෝතාදි සෙසු සම්ඵස්ස පිළිබඳ ව ද මෙසේ ම ය. ලොව යම් ප්‍රිය ස්වභාවයක් සැප (මධුර) ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටන්නේ චක්ඛු සම්ඵස්ස ආදි ස්පර්ශ හයෙහි තෘෂ්ණාව නිසා බව නුවණින් මෙනෙහි කරයි.

**5. චක්ඛු සම්ඵස්සජා වේදනා, සෝත සම්ඵස්සජා වේදනා, ඝාන සම්ඵස්සජා වේදනා, ජිව්හා සම්ඵස්සජා වේදනා, කාය සම්ඵස්සජා වේදනා, මනෝ සම්ඵස්සජා වේදනා යන වේදනා හය**

ලොව යම් ප්‍රිය ස්වභාවයක් මධුර ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටන්නේ ඇස, රූපය, විඤ්ඤාණය හා ස්පර්ශය ඇසුරින් හටගන්නා වේදනා පිළිබඳ තෘෂ්ණාව නිසා බව නුවණින් මෙනෙහි කරයි. සෝත සම්ඵස්සජා වේදනා ආදි සෙසු වේදනා පිළිබඳ ව ද මෙසේ ය.

**6. රූප සඤ්ඤා, සද්ද සඤ්ඤා, ගන්ධ සඤ්ඤා, රස සඤ්ඤා, ඵොට්ඨබ්බ සඤ්ඤා, ධම්ම සඤ්ඤා යන හැඳිනීම් හය**

ලොව යම් ප්‍රිය ස්වභාවයක් මධුර ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටන්නේ ඇස, රූප, විඤ්ඤාණ, ඵස්ස, වේදනා ඇසුරින් හටගන්නා රූප සඤ්ඤා විෂයයෙහි බව නුවණින් මෙනෙහි කරයි. සද්ද සඤ්ඤා ආදි සෙසු සඤ්ඤා පිළිබඳ ව ද මෙසේ ම දත යුතු ය.

**7. රූප සඤ්චේතනා, සද්ද සඤ්චේතනා, ගන්ධ සඤ්චේතනා, රස සඤ්චේතනා, ඵොට්ඨබ්බ සඤ්චේතනා, ධම්ම සඤ්චේතනා යන චේතනා, සිතිවිලි හෙවත් සංස්කාර හය**

ඇස, රූප, විඤ්ඤාණ, ඵස්ස, වේදනා, සඤ්ඤා යන රූප, වේදනා, සඤ්ඤා, විඤ්ඤාණ ඇසුරින් හටගන්නා චේතනා මෙයින් කියැවේ. ලොව යම් ප්‍රිය ස්වභාවයක් සැප ස්වභාවයක් වේ නම් එය හටගන්නේ

පිහිටන්නේ සඤ්චේතනා විෂයයෙහි බව නුවණින් මෙනෙහි කරයි. සද්ද සඤ්චේතනා ආදි සෙසු චේතනා පිළිබඳ ව ද මෙසේ ම ය.

**8. රූප තණ්හා, සද්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, ඵොට්ඨබ්බ තණ්හා, ධම්ම තණ්හා යන රූපාදි බාහිර අරමුණු පිළිබඳ ආශා හය**

ලොව යම් ප්‍රිය ස්වභාවයක් සැප (මධුර) ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටා සිටින්නේ රූපය පිළිබඳ ආශාව නිසා බව නුවණින් මෙනෙහි කරයි. සද්ද තණ්හා ආදි සෙසු ආශාවන් පිළිබඳව ද එසේ ම ය.

**9. රූප විතක්ක, සද්ද විතක්ක, ගන්ධ විතක්ක, රස විතක්ක, ඵොට්ඨබ්බ විතක්ක, ධම්ම විතක්ක යන විතර්ක හය**

ලොව යම් ප්‍රිය ස්වභාවයක් මධුර ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටා සිටින්නේ රූපාදි විතර්ක හය පිළිබඳ තෘෂ්ණාව නිසා බව නුවණින් යළි යළිත් මෙනෙහි කරයි.

**10. රූප විචාර, සද්ද විචාර, ගන්ධ විචාර, රස විචාර, ඵොට්ඨබ්බ විචාර, ධම්ම විචාර යන විචාර හය**

ලොව යම් ප්‍රිය ස්වභාවයක් සැප (මධුර) ස්වභාවයක් වේ නම් එය හටගන්නේ පිහිටා සිටින්නේ රූප විචාර ආදි විචාර හය විෂයයෙහි තෘෂ්ණාව හෙවත් ඇල්ම නිසා බව නුවණින් මෙනෙහි කරයි.

යමෙකුට ලොව පවත්නා ඕනෑ ම දෙයක් පිළිබඳ තෘෂ්ණාවක් හටගනී නම් ඊට මුල් වන්නේ ඉහත කී කරුණු හැටෙන් කිසියම් කරුණකට ය. මෙමගින් චිත්ත සන්තානයෙහි තෘෂ්ණාව ජනිත වන සියලු ම ආකාර ඉතා පැහැදිලි ව මෙන් ම සවිස්තරාත්මක ව සඳහන් ව ඇත. දුක්ඛ සමුදය සත්‍යය පිළිබඳ ව දක්වෙන මෙම විග්‍රහය මගින් බුදුදහමේ හේතුඵල සිද්ධාන්තය ද ප්‍රකට වේ. එනම් දුක හටගන්නේ තෘෂ්ණාව නිසා ය යන අදහසයි.

දුක්ඛ නිරොධ සත්‍යයෙන් දක්වෙන්නේ දුක නිරුද්ධ කිරීමට අදාළ කරුණු ය. ඒ අනුව ඉහත දක්වූ චක්ඛු ආදි ආධ්‍යාත්මික ආයතන, රූපාදි බාහිර ආයතන, චක්ඛු විඤ්ඤාණය ආදි විඤ්ඤාණ හය, චක්ඛු සම්ඵස්සය ආදි ස්පර්ශ, චක්ඛු සම්ඵස්සජා වේදනාව ආදි වේදනා, රූප සඤ්ඤාව ආදි සඤ්ඤා, රූප සඤ්චේතනාව ආදි චේතනා, රූප තණ්හාව ආදි තෘෂ්ණා, රූප විතක්කය ආදි විතර්ක, රූප විචාරය ආදි විචාර යන හය බැගින් වූ කරුණු දහය අරභයා හැට තැනෙක්හි පවත්නා තෘෂ්ණාව නිරුද්ධ වන්නේ ද එකී ස්ථානයන්හි ම බව අවධාරණය කෙරේ. මින් දක්වෙන්නේ තෘෂ්ණාව හෙවත් දුක හට ගත්තේ යම් තැනෙක්හි ද එම තෘෂ්ණාව හෙවත් දුක නිරුද්ධ වන්නේ ද එම ස්ථානයන්හි ම බවයි. මෙකී යථාර්ථය නුවණින් මෙනෙහි කිරීමට මෙමගින් අනුශාසනා කෙරේ.

දුක්ඛනිරෝධගාමිනී පටිපදා ආර්ය සත්‍යය හෙවත් මාර්ග සත්‍යය වශයෙන් දක්වෙන්නේ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන අංග අටෙන් යුත් ආර්ය මාර්ගයයි. මෙහි දී එම අංග එකිනෙකක් සවිස්තරාත්මක ව දක්වා තිබේ. නිර්වාණාවබෝධය සඳහා බුදුරදුන් වදාළ ඉගැන්වීම් රැසක් මෙම අංග අටෙහි ඇතුළත් ව ඇත. සක්කාය දිට්ඨිය නමැති පළමු සංයෝජනය පිරිසිඳ දැන ගැනීමේ මාවත වශයෙන් ද දක්වා ඇත්තේ මෙම ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. ඇත, නැත හෙවත් ශාශ්වත, උච්ඡේද යන අන්තද්වය දුරු කොට මධ්‍යම ප්‍රතිපදාව ලෙස ඉගැන්වෙන මාර්ග සත්‍යයට අයත් කරුණු නුවණින් සම්මර්ශනය කිරීමෙන් ධර්මයන් අරභයා තව දුරටත් ඥානය උපදී. එමගින් සසර අනාදිමත් කාලයක් වර්ධනය කරමින් පැමිණි සුභ, සුඛ, නිත්‍ය, ආත්ම යන සතර විපල්ලාස දුරු වී දුකින් නිදහස් වීම සඳහා වූ ඥානය වර්ධනය වේ.

ඉහත දක්වූ චතුරාර්ය සත්‍යයට අයත් අංග සතර අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධතාවක් දක්වයි. එනම් දුක පිළිබඳ අවබෝධය ලැබූ පමණට දුක්ඛ සමුදය හෙවත් දුකට හේතුව වූ තෘෂ්ණාව පිළිබඳ ව අවබෝධ වී දුක්ඛ නිරෝධය වූ නිවන පිළිබඳ අභිරුචියක් ජනිත ව මාර්ගය වූ ආර්ය අෂ්ටාංගික මාවතෙහි ගමන් කිරීම ද සිදු වේ. චතුරාර්ය සත්‍යයෙහි දුක පිළිබඳ විග්‍රහයේදී හේතුඵල සිද්ධාන්තය පිළිබඳ සංක්ෂිප්ත

විග්‍රහය ද ඇතුළත් වේ. එනම් 'තෘෂ්ණාව ඇති විට දුක ඇති වේ. තෘෂ්ණාව නැති වීමෙන් දුක නැති වේ ය. තෘෂ්ණාව ඉපදීමෙන් දුක උපදී, තෘෂ්ණාව නිරුද්ධ වීමෙන් දුක නිරුද්ධ වේ ය යන සිද්ධාන්තයයි (*අස්මිං සති ඉදං හොති අස්මිං අසති ඉදං නහොති. ඉමස්ස උප්පාද ඉදං උප්පජ්ජති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති*).

1. අනිත්‍ය වශයෙන් මෙනෙහි කිරීමෙන් නිත්‍යසංඥාව දුරුවේ - (*අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති*).
2. දුක් වශයෙන් මෙනෙහි කිරීමෙන් සුඛ සංඥාව දුරුවේ - (*දුක්ඛතො අනුපස්සන්තො සුඛසඤ්ඤං පජහති*).
3. අනාත්ම වශයෙන් මෙනෙහි කිරීමෙන් ආත්ම සංඥාව දුරුවේ - (අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං පජහති).
4. යථාවබෝධයෙන් යුතු කළකිරීමෙන් නන්දි රාගය දුරුවේ - (*නිබ්බින්දතො නන්දිං පජහති*).
5. නොඇලීමෙන් රාගය දුරුවේ - (*විරජ්ජන්තො රාගං පජහති*).
6. නිරෝධය දැකීමෙන් හටගැනීම පිළිබඳ නොදැනීම දුරුවේ - (*නිරොධෙන්තො සමුදයං පජහති*).
7. දුරුලීමෙන් දැඩිව ගැනීම දුරුවේ - (*පටිනිස්සන්තො ආදානං පජහති*).

සතර සතිපට්ඨානයට අනුගත ව රූපාදි ස්කන්ධ අනිත්‍ය වශයෙන් නුවණින් බැලීමෙන් නිත්‍ය සංඥාව ද දුක් වශයෙන් බැලීමෙන් සුඛ සංඥාව ද අනාත්ම වශයෙන් බැලීමෙන් ආත්ම සංඥාව ද නිබ්බිද (කළකිරීම්) වශයෙන් බැලීමෙන් නන්දිය (ඇලීම) ද විරජ්ජ (නොඇලීම්) වශයෙන් බැලීමෙන් රාගය ද නිරෝධ වශයෙන් බැලීමෙන් සමුදය (හටගැනීම) ද පටිනිස්සග්ග (අත්හැරීම්) වශයෙන් බැලීමෙන් ආදානය (දැඩි ව අල්වා ගැනීම) ද අත්හරියි. අනිත්‍ය ආදි සත් ආකාරයෙන් කාය, වේදනා, චිත්ත, ධම්ම පිළිබඳ ව සම්මර්ශනය කිරීමෙන් සිහිය හා නුවණ වැඩෙන අතර එම නුවණින් යළි යළිත් කායාදි ස්කන්ධ පංචකය නුවණින් දකියි. ස්කන්ධ පංචකය පිරිසිඳ දැන ඒට ඇති ඇල්ම සපුරා දුරුකොට සසර දුකින් නිදහස් වීමේ ඒකායන මාවත මෙම සතර සතිපට්ඨානයෙන් පැහැදිලි කොට ඇත. එම නිසා භාග්‍යවතුන් වහන්සේ සතර සතිපට්ඨානය කුශලරාශිය වශයෙන් කුසලරාසි සූත්‍රයෙහි දී හඳුන්වා දෙති (*කුසලරාසී'ති භික්ඛවෙ, වදමානො චත්තාරො සතිපට්ඨානෙ සම්මා වදමානො වදෙය්‍ය*.).

කය, වේදනා හා සිත පිළිබඳව යළි යළිත් යොනිසොමනසිකාරයෙහි යෙදීමේ ප්‍රතිඵල වශයෙන් ඒවායේ පවත්නා නිසරු බව යළි යළිත් ප්‍රකට වෙයි. ඒ අනුව කය පෙණපිඩක් මෙන් ද වේදනාව දියබුබුලක් මෙන් ද සඤ්ඤාව මිරිඟුවක් මෙන් ද සංඛාර කෙසෙල් කඳක් මෙන් ද සිත හෙවත් විඤ්ඤාණය මායාවක් ලෙස ද දකිමින් ජීවිතයේ යථාර්ථය පසක් කර ගනියි. ඇලීම් ගැටීම්වලින් මිදී උපේක්ෂාවෙන් යුතු ව ජීවිතය දෙස යථාර්ථවාදී ව බැලීමට හුරු වෙයි.

## අනුත්තර ඉන්ද්‍රිය භාවනාව

ඉන්ද්‍රිය භාවනා සූත්‍රයෙහි දක්වෙන පරිදි යමෙක් මෙලෙස නිතර සිහියෙන් හා නුවණින් වාසය කිරීමට සමත් වුවහොත් ඔහු යළි යළිත් අවිද්‍යා සහගත වූ ස්කන්ධ පංචකයක් හට නොගන්නා සේ වහාම කෙලෙසුන්ගෙන් ඉවත් වෙයි. තමා ඉන්ද්‍රිය සංවර තුළින් කෙලෙසුන්ගෙන් සිත මුදවා ගත් පමණට හා සිහිය භාවිත කොට ඇති පමණට තමා කැමැති පරිදි තම සිත වසග කොට වාසය කිරීමට අවකාශ සැලසේ. එපමණට දුකින් නිදහස් ව උසස් ආධ්‍යාත්මික සංතෘප්තියකින් ජීවත් වීමට අවස්ථාව උදාවේ. මෙහි දී ආර්ය විනයෙහි අනුත්තර ඉන්ද්‍රිය භාවනාව, සේඛ ප්‍රතිපදාව හා භාවිතින්ද්‍රිය පුද්ගලයා යනුවෙන් කොටස් තුනක් යටතේ ඉන්ද්‍රිය සංවරය දක්වා තිබේ.

ආර්ය විනයෙහි අනුත්තර ඉන්ද්‍රිය භාවනාව

ඒ අනුව ඇසට රූපයක් පතිත වන විට ඇසිපිය ගසන තරම් මඳ වේලාවකදී ද කණට ශබ්දයක් පතිත වීමේ දී අසුරු සැණක් තරම් ස්වල්ප වේලාවකදී ද නාසයට ගන්ධයක් පතිත වීමේ දී නෙළුම් පතක ඇති දිය බිඳක් බිමට පතිත වන තරම් වේගයෙන් ද දිවට රසයක් පතිත වන විට දිවඅග රැඳි කෙළ පිඩක් බිමට පතිත වන තරම් මඳවේලාවකදී ද කයට ස්පර්ශයක් පතිත වන විට ශක්තිමත් පුරුෂයකු දිගු කළ අතක්

නවන තරම් ස්වල්ප වේලාවකදී ද සිතට ධර්මාලම්භනයක් පතිත වීමේදී රත්කළ යකඩ බඳුනකට දියබිඳක් දමන විට එය වියළී යන තරම් සුළු වේලාවක දී ද වශයෙන් දක්වෙන පරිදි ඉතා ඉක්මනින් අරමුණු විෂයයෙහි ප්‍රිය අප්‍රිය බව දුරු වී සිත උපෙක්ෂාවෙහි පිහිටයි. මෙයින් දක්වෙන්නේ දහම් දැනුමෙන් හෙබි සිහි නුවණින් යුතු තැනැත්තා කෙතරම් දක්ෂ අයුරින් දුකින් නිදහස් වීමට සමත් ද යන්නයි.

සේඛ ප්‍රතිපදාව

නිවන් මගට ස්ථිරව බැසගත් (සේඛ) පුද්ගලයාගේ ස්වභාවය ද ඉන්ද්‍රිය භාවනා සූත්‍රයෙහි වැඩිදුරටත් විස්තර කර ඇත. ඒ අනුව සේඛ පුද්ගලයා ඇස, කණ ආදි ඉන්ද්‍රියයන්ට රූප, ශබ්දදිය පතිත වීමේ දී එමගින් සිතෙහි කෙලෙස් හට ගැනීමේ දී සිහිනුවණින් සිටීමේ හේතුවෙන් එයින් ලජ්ජාවට පිළිකුළට පත් ව (*අට්ටීයති හරායති ජිගුච්ඡති*) වහා ම එම අකුසලයෙන් සිත මුදවා ගැනීමට දක්ෂ වෙයි. පිරිසිදුව සිටින තැනැත්තාගේ කයට කුණු වී ගිය සතෙකුගේ මළ කුණක් දමන විට ඇති වන පිළිකුලට බඳු පිළිකුලක් මෙයින් ඇති කර ගන්නා ශ්‍රැතවත් ශ්‍රාවකයා වහාම එයින් ඉවත් වීමට කටයුතු කරයි. ඇස, කණ ආදී ඉන්ද්‍රිය පිළිබඳව මනා සිහියෙන් සිටීමේ ආනිසංස වශයෙන් මෙබඳු හැකියාවක් උදවේ.

භාවිතින්ද්‍රිය පුද්ගලයා

ඉන්ද්‍රිය භාවනා සූත්‍රයට අනුව ඉහළින් ම ඉඳුරන් සංවර කර ගත් පුද්ගලයාගේ ස්වභාවය විස්තර කර තිබේ. ඒ අනුව ඔහු තම සිත සපුරා සංවර කර ගැනීම හේතුවෙන් පිළිකුල් සහගත අරමුණෙහි නොපිළිකුල් සහගතව ද නොපිළිකුල් අරමුණෙහි පිළිකුල් සහගතව ද අවශ්‍ය නම් පිළිකුල් නොපිළිකුල් බව යන දෙක ම දුරු කොට මැදහත් ව ද සිටීමේ හැකියාව ඔහුට ඇත. ඒ අතර පිළිකුල් දෙයෙහි පිළිකුල් සහගතව ද නොපිළිකුල් දෙයෙහි නොපිළිකුල් සහගතව ද දැකීමට හැකියාව ඇත. මෙලොව උපත ලද උත්තම මනුෂ්‍ය රත්නයකට ලද හැකි උත්තරීතර භාග්‍යය මෙමගින් පැහැදිලි කෙරේ.

## කිංසුකෝපම සූත්‍රය

බුදුදහමට අනුව මනාව තම ඉඳුරන් සංවර කරගත් (භාවිතින්ද්‍රිය) තැනැත්තාගේ ස්වභාවය කිංසුකෝපම සූත්‍රයෙහි උපමානුසාරයෙන් මැනැවින් විස්තර කර තිබේ. ඒ අනුව දොරටු හයක් සහිත ප්‍රාකාරයකින් වට වූ කිසියම් නගරයක් පිහිටා තිබේ. එහි දොරටු හයෙහි දොරටුපාලයන් සිටින අතර නගරය මැද සිව්මං සලෙහි නගර හිමියා වාසය කරයි. කිසියම් දූත යුවලක් (පනිවුඩකරුවන් දෙදෙනක්) එක්තරා පනිවුඩයක් රැගෙන එකී මාවත ඔස්සේ ගමන් කොට දොරටු පාලයාගේ අධීක්ෂණය මත ඇතුළු වී නගර මැද සිටින නගර හිමියාට එම පනිවුඩය දී ආ මගින් ම නගරයෙන් ඉවත් වී යයි. මෙම උපමාවෙන් භාග්‍යවතුන් වහන්සේ ඉදිරිපත් කරන්නේ මැනැවින් දහම ප්‍රගුණ කොට උපරිම ලෙස සිහිය හා නුවණ පවත්වා ගන්නා ශ්‍රාවකයකු ක්‍රියා කරන ආකාරයයි. ඒ අනුව සමථ - විදර්ශනා නමැති දහමින් යුතුව නිරතුරුව සිහිනුවණින් සිටින විට ඇස ආදි ඉන්ද්‍රියයන්ට රූපාදි අරමුණු පතිත වන විට එය සිව්මංසල නමැති සතරමහා භූතරූපයෙන් යුතු ගුහාවෙහි වෙසෙන විඤ්ඤාණය නමැති නගර හිමියාට යථා පරිදි දන්වා ඇතුළු වූ මාවතින් (ආයතනයෙන්) ම ඉවත් ව ගිය හොත් රූපාදි කිසිදු අරමුණක සිත බැස නොගන්නා අතර ඒ මොහොතෙහි ම දුකින් නිදහස්වීමට අවස්ථාව උද වේ. බුදුදහමින් දක්වෙන පරිදි ස්කන්ධ පංචකය නමැති මහා බර බහා තැබීමේ ප්‍රතිඵලය මෙයයි.

## බාහිය සූත්‍රය

බාහිරය දරුචීරයට බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ද භාවිතින්ද්‍රිය පුද්ගලයකු කටයුතු කරන ආකාරයයි. ඒ අනුව යමෙක් උපරිම ලෙස සිහිය හා නුවණ තුළ සිටීමට දක්ෂ වුවහොත් ඇසින් රූපයක් දැකීමේ දී ඒ මොහොතෙහි ම එහි ක්‍රියාකාරීත්වය, හේතුඵල සම්බන්ධය, අනිත්‍යතාව නුවණින් දැක වහාම දුකින් නිදහස්වීමට අවස්ථාව උදවේ. *'දිට්ඨෙ දිට්ඨමත්තං සුතෙ සුතමත්තං මුතෙ මුතමත්තං විඤ්ඤාතෙ*

*විඤ්ඤාතමත්තං'* වශයෙන් භාග්‍යවතුන් වහන්සේ දේශනා කළේ රූප ශබ්දදියෙහි සංවර විය යුතු ආකාරයයි (බාහිය සුත්ත, උදානපාළි). ඇස, කණ ආදි කිසියම් ආයතනයකින් රූප, ශබ්දදි කිසියම් අරමුණක් ගැනීමේ දී එක ආයතනයකින් ගන්නා අරමුණ අනික් ආයතනයට ඒ අයුරින් ම ආපාත නොවන අතර එක ආයතනයකින් ගන්නා අරමුණ අනෙක් ආයතනයට ගෝචර නොවේ. වතුර බේසමකට මුහුණ යොමු කළ කල්හි එහි පෙනෙන රූප ඇසට පමණක් විෂය වන්නකි. එම රූපය කණින් ඇසීමට හෝ නාසයෙන් ගඳ සුවඳ ආඝ්‍රාණයට හෝ දිවෙන් රස විඳීමට හෝ ශරීරයෙන් ස්පර්ශ කිරීමට හෝ නොහැක්කකි. කණ, නාසය ආදි ආයතනයන්ට පතිත වන ශබ්ද, ගන්ධ ආදි සෙසු අරමුණු පිළිබඳ වුව ද තත්ත්වය මෙසේ ය. තවද ඇසට රූපයක් සම්බන්ධ වීමේ දී ඇස, රූපය, චක්ඛු විඤ්ඤාණය, චක්ඛු සම්ඵස්සය ආදි ඊට අදළ සියලු ක්‍රියාකාරීත්වයන් පෙර පසු නොවී ඒ මොහොතට හටගන්නා ස්වභාවයෙන් යුක්ත වේ. ඒ සියල්ල පෙර නොතිබී හටගෙන ඉතිරි නැතිව නිරුද්ධ වේ (අහුත්වා සම්භූතං හුත්වා න භවිස්සති).

මෙලෙස නිතර සිහියෙන් හා නුවණින් (*සදසතෝ*) වාසය කිරීමෙන් අප ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය තුළින් අවබෝධයක් ලබන විට එනම් අතීත කර්ම විපාක වශයෙන් ආයතන හා අරමුණු සම්බන්ධ වීමේ දී විඥාන චර්යා හටගන්නා කල්හි එහි මුළා නොවී සිටීමටත් එය ඥාන චර්යාවක් බවට පත් කර ගැනීමටත් අවස්ථාව සැලසේ (පටිසම්භිදමග්ග 1, 152 පිට, චරියානානත්තඤාණ). දුකින් සපුරා නිදහස් ව වාසය කළ හැක්කේ මෙබඳු භාවිතයක් තුළිනි.

## තථාගතයන් වහන්සේ විසින් දේශිත අනුපූර්ව ප්‍රතිපදාව

මහාසතිපට්ඨාන සූත්‍රයට අනුව ඉතා පැහැදිලි කරුණක් වන්නේ දුකින් නිදහස් වීමේ සම්පූර්ණ වැඩපිළිවෙළ රඳා පවත්නා ස්කන්ධ පංචකය සහිත පුද්ගලයා තුළ බවයි. කල්‍යාණමිත්‍ර ආශ්‍රය, සද්ධර්මශ්‍රවණය ආදි සාධක බාහිරින් ලැබුණ ද සසරින් මිදීමට අවශ්‍ය ක්‍රියාකාරීත්වය සත්ත්වයා වෙත වූවකි. බුදුරජාණන් වහන්සේ රෝහිතස්ස දෙවියාට දේශනා කළේ 'මේ බඹයක් පමණ වූ සඤ්ඤා සහිත සිත සහිත කයෙහි ම ලෝකයත්, ලෝක සමුදයත්, ලෝක නිරෝධයත්, ලෝක නිරෝධගාමිනී පටිපදාවත් පනවන බවයි' (රෝහිතස්ස සුත්ත, ස.නි.1, 118 පිට) භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ පරිදි දර්ශන සම්පත්තියෙන් හා සීලයෙන් යුතුව සතිපට්ඨානය සම්පූර්ණ කළ පමණට ප්‍රඥාව දියුණු වන අතර එපමණට සද්ධා, විරිය, සමාධි ආදි සෙසු ඉන්ද්‍රිය ධර්මයන් ද සම්පූර්ණත්වයට පත් වේ.

අවිජ්ජා සූත්‍රයට අනුව සතර සතිපට්ඨානය නිසි ලෙස වැඩෙන්නේ ත්‍රිවිධ සුචරිතය ඇති විටයි. ත්‍රිවිධ සුචරිත සම්පූර්ණ වීමට ඉන්ද්‍රිය සංවරයත් ඉන්ද්‍රිය සංවරය සඳහා සතිසම්පජඤ්ඤයත් සතිසම්පජඤ්ඤය සඳහා යෝනිසෝ මනසිකාරයත් යෝනිසෝ මනසිකාරය සඳහා ශ්‍රද්ධාවත් ශ්‍රද්ධාව සඳහා සද්ධර්මශ්‍රවණයත් සද්ධර්මශ්‍රවණය සඳහා කල්‍යාණමිත්‍ර ආශ්‍රයත් අවශ්‍ය කෙරේ. කල්‍යාණමිත්‍ර ආශ්‍රය ඇති විට සද්ධර්මශ්‍රවණය ලැබී එයින් ශ්‍රද්ධාවත් ශ්‍රද්ධාවෙන් යොනිසො මනසිකාරයත් යොනිසො මනසිකාරයෙන් සතිසම්පජඤ්ඤයත් සතිසම්පජඤ්ඤයෙන් ඉන්ද්‍රිය සංවරයත් ඉන්ද්‍රිය සංවරයෙන් ත්‍රිවිධ සුචරිතයත් ත්‍රිවිධ සුචරිතයෙන් සතර සතිපට්ඨානයත් සතර සතිපට්ඨානයෙන් සත්ත බොජ්ඣංගත් පරිපූර්ණත්වයට පත් ව විද්‍යාවිමුක්තිය සාක්ෂාත් වේ. මෙලෙස විද්‍යාවිමුක්තිය නිෂ්ඨාව කොට ඇති සම්බුදු දහම් මගෙහි සියලු ගුණරුවන්හි ප්‍රධාන සාධකය වන්නේ කල්‍යාණමිත්‍ර ආශ්‍රයයි. හුදෙක් කල්‍යාණ මිත්‍රයන් සිටීම පමණක් ප්‍රමාණවත් නොවන අතර කල්‍යාණමිත්‍රයන් හඳුනා ගැනීමටත් ඔවුන්ගේ ගුණයට ගරුකිරීමටත් ඔවුන් වෙතින් තම දිවිමගට ආලෝකයක් වූ සද්ධර්ම ප්‍රතිලාභය ළඟා කර ගැනීමටත් අප දක්ෂ විය යුතු ය. බුද්ධිමත් විය යුතු ය. අනතිමානී විය යුතු ය. කෙටියෙන් කිවහොත් (කරණීය) මෙත්ත සූත්‍රයෙහි ඇති ගුණාංගයන්ගෙන් සමන්විත විය යුතු ය. මෙකී සියලු ගුණ දහම්හි උසස් ම ප්‍රතිඵලය වන්නේ ප්‍රඥාව දියුණු වී දුකින් නිදහස්වීමයි. එහි දී රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පංචකය ක්ෂණිකව හටගෙන ඉතිරි නැතිව නිරුද්ධ වන බව මැනැවින් ප්‍රකට වේ. ඒ අතර ධාතු, ආයතන, ඉන්ද්‍රිය, නාමරූප ආදි නම්වලින් සඳහන් වන ජීවිතයේ පැවැත්ම විස්තර කෙරෙන සෙසු ධර්මයන්හි ද පවත්නා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය මැනැවින් ප්‍රත්‍යක්ෂ වේ. මෙම අවබෝධය ලබනු වස් අප්‍රමාදී ව ක්‍රියා කිරීම ක්ෂණ සම්පත්තිය ලද බුද්ධිමත් සැමගේ ප්‍රධාන ජීවිත ඉලක්කය විය යුතු ය. භාග්‍යවතුන් වහන්සේගේ අවසාන අවවාදය වූයේ

ද අප්‍රමාදීව සතිපට්ඨානය තුළ හැසිරෙන ලෙසයි (*හන්ද'දනි භික්ඛවෙ ආමන්තයාමි වො වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදථෙ,* මහාපරිනිබ්බාන සුත්ත, දී..නි.2,). තමාට තමා පහනක් - දිවයිනක් කොට වාසය කළ හැකි ප්‍රතිපදව ලෙස භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන්නේ සතර සතිපට්ඨානයට අනුව වාසය කිරීමයි. එවිට බාහිර කිසිදු පුද්ගලයකුට හෝ ද්‍රව්‍යයකට කිසිදු ඇවස්ථාවක තමා වෙත දුක ඇති කළ නොහැකි වනු ඇත.

***'අත්තදීපා භික්ඛවේ විහරථ අත්තසරණා, න අඤ්ඤසරණා***
***ධම්මදීපා භික්ඛවේ විහරථ ධම්මසරණා න අඤ්ඤසරණා'***

තමාට තමා පහනක් / දිවයිනක් සරණක් කර ගන්න, වෙනත් සරණක් නොමැත.
ධර්මය තමාට පහනක් / දිවයිනක් සරණක් කර ගන්න, වෙනත් සරණක් නොමැත.

ඔබ සැමට තෙරුවන් සරණයි !

ලොස් ඇන්ජලිස් බෞද්ධ විහාරය, පැසදිනා

# භික්ෂු භාවනා සම්භාෂණය

(බු.ව. 2563 වප් / ව්‍ය.ව. 2019 ඔක්තෝබර් 03 වන ගුරු දින)